NATIONAL CHRISTIAN EVANGELICAL ALLIANCE
SRI LANKA



# උපායමාර්ගික නඩු පැවරීමේ අත්පොත

ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සම්බන්ධයෙන්

මැයි 2021

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සම්බන්ධයෙන් උපායමාර්ගික නඩු පැවරීමේ අත්පොත
2022, මැයි මස, කොළඹදී
සියලු හිමිකම් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය සතුය
සැකසුම - ශෙනාල් ජේසුඩියන්

# පිදුම

මෙම අත්පොත ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානයේ (NCEASL) ප්‍රකාශනයකි. මෙය සම්පාදනය කිරීමට දායක වූ ආචාර්ය ගෙහාන් ගුණතිලක, අර්මිසා ටීගල් හා නීතිඥ මල්සිරිනි ද සිල්වා යන අයගේද අදහස් දැක්වීම මඟින් මෙම අත්පොත ප්‍රතිපෝෂණය කල නීතිඥ ලක්ෂාන් ඩයස් සහ යාමිනී රවීන්ද්‍රන්, ශලෝම් ඩැනියෙල්, ජෙශාන් ජෙගසෝති හා නවිඳු මෙන්ඩිස් යන අයගෙන් සමන්විත NCEASL කණ්ඩායමේද සහය මින් අගය කරමු.

# පටුන


1. FoRB උල්ලංඝනයක් හඳුනාගන්නේ කෙසේද?.......... 9

2. වැදගත් නීතිමය විධිවිධාන.......... 13

3. නඩුවකට සූදානම්වීම සඳහා මාර්ගෝපදේශ.......... 23

4. FoRB නඩුකර හැසිරවීම.......... 27

5. මාධ්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීම.......... 49

6. ඇමුණුම 1 .......... 51

# හැඳින්වීම

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 18වැනි වගන්තියෙන් ආගමික සහ ආගමික නොවන විශ්වාස සඳහා පුළුල් ආරක්ෂාවක් ලබාදී තිබේ. එම අයිතියට 'තමන් කැමති ආගමක් හෝ විශ්වාසයක් දැරීමට හෝ පිළිගැනීමට ඇති නිදහස ද, තනිවම හෝ අන්‍යයින් සමගින් එක්වී, සහ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව වන්දනා කිරීම, පිළිපැදීම, ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම හරහා තමන්ගේ ආගම ප්‍රකාශ කිරීමේ නිදහස ද' ඇතුළත් වන බව එහි සඳහන් වේ. 18 වැනි වගන්තියෙන් ලබාදෙන ආරක්ෂාව දේවවාදී, දේවවාදී-නොවන, අදේවවාදී අදහන්නන් කරා ද, කිසිදු ආගමක් හෝ විශ්වාසයක් නොමැති අය කරා ද පැතිර පවතියි.[1] මෙම වගන්තියේ, 1) ***forum internum*** (තමන් කැමති ආගමක් හෝ විශ්වාසයක් දැරීමට, වෙනස් කිරීමට සහ වැළඳ ගැනීමට ඇති අයිතිය), සහ 2) ***forum externum*** (ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමට ඇති නිදහස)[2] යන ප්‍රධාන අංග දෙකක් ඇති බව කියැවේ. ශ්‍රී ලංකාවේ මෑතකදී කළ අධ්‍යයනයකට අනුව, සුළුතර ආගමික කණ්ඩායම්වල මින් දෙවැනි අයිතිය තර්ජනයට ලක් වී ඇතැයි සලකනු ලැබේ. උදාහරණ වශයෙන්, වසර හතරක කාලයක් තුළ ක්‍රිස්තියානි බැතිමතුන්ට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩ සිදුවීම් මෙම අධ්‍යනයෙන් විශ්ලේෂණය කළ අතර, ශාරීරික නොවන සිදුවීම්වලින් සියයට 87ක්ම 'ප්‍රධාන වශයෙන්ම ආගමික ස්ථාන සහ පූජකවරුන් ඉලක්ක කරමින් සිදු වූ ක්‍රියා හෝ පරිචයන් පෙන්නුම් කළ බව එහිදී සොයාගන්නා ලදී.[3] මුස්ලිම් ප්‍රජාව 'වරින් වර සිදුවූ තියුණු ප්‍රචණ්ඩ සිදුවීම් ගණනාවක්' සඳහා මුහුණ දී ඇති බවත් උතුරේ සහ නැගෙනහිර 'සිංහලකරණය/ බෞද්ධකරණය' සම්බන්ධයෙන් වාර්තාවීමත් සමගින් හින්දු ප්‍රජාව වෙනස්කොට සැලකීමට මුහුණ දුන් බවත් එහි තවදුරටත් සඳහන් වේ.[4]

මේ සිදුවීම්වලින් සැලකියයුතු සංඛ්‍යාවක් අධිකරණය ඉදිරියේ නඩුපැවරීම් සඳහා විෂයයවීමට සෑහෙන ඉඩක් තිබේ. ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ (FoRB) නඩු සාමාන්‍යයෙන් එනමින් හඳුන්වන්නේ නැත. මූලික අයිතිවාසිකමක් උල්ලංඝනයවීමක්, රිට් අයදුමක්, අපරාධ නඩුවක් හෝ මහජන කරදරය යටතේ සලකන කරුණක් වශයෙන් මෙම කරුණු සම්බන්ධයෙන් නඩුපවරනු ලැබීමට ඉඩ තිබේ.

නීතියේ ප්‍රමාදය යනු තවමත් විසඳී නොමැති, තදබලවූත් පද්ධතිගතවූත් ප්‍රශ්නයකි. දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩුවිධාන සංග්‍රහය සංශෝධනය කිරීමට පත්කළ විශේෂ කමිටුවක් 2017 දී නිකුත්කළ වාර්තාවකට අනුව, අපරාධ නඩුවිභාගයක් අවසාන කිරීමට ගතවන සාමාන්‍ය කාලය වර්ෂ 10.2 කි. අභියාචනා ක්‍රියාවලියට තවත් අවුරුදු හතක් ගත වේ. FoRB නඩුවිභාග පහළ අධිකරණවල දශකයකට වැඩි කාලයක් තිස්සේ 'විභාග වෙමින්' පැවතීමට ඉඩ තිබේ. ඇතැම් අවස්ථාවල, සිද්ධියෙන් වසර ගණනාවකට පසුව සාක්ෂිකරුවන් විසින් සාක්ෂි දීම හෝ වෙනත් වැදගත් සාක්ෂි ඉදිරිපත්වීමට ඉඩ තිබේ. නඩුවට අදාළ සියළුම කටයුතු අතින් සිදුකෙරෙන බැවින්, සාක්ෂි සාක්ෂි විනාශ කිරීම හෝ හානිකිරීම වැනි දෑ හේතුවෙන් සාක්ෂි නැතිවීම ද සිදුවිය හැක. මේවා, FoRB වින්දිතයින්ට මුහුණ දෙන්නට සිදුවිය හැකි ආයතනික අභියෝග අතරින් කිහිපයක් වේ, FoRB උල්ලංඝන සම්බන්ධයෙන් කලට වේලාවට අභියෝග කිරීම, ඒ සඳහා නිවැරදි අංගය තෝරාගැනීම, සහ නඩුවට සිදුකෙරෙන පූර්ව-සූදානම FoRB නඩුකරවලට සම්බන්ධවන ශ්‍රී ලාංකික නීතිවේදීන්ට ඉතාමත් වැදගත් වේ.

නඩුපැවරීම සම්බන්ධයෙන් සකසා ඇති මෙම අත්පොතේ අරමුණු වන්නේ: 1) FoRB සම්බන්ධයෙන් පවතින නීතිරාමුව පිළිබඳව නීතිවේදීන් හුරුපුරුදු කිරීම, සහ 2) FoRB රාමුව තුළ ඔවුන්ගේ නඩුව ස්ථානගත වන තැන හඳුනාගෙන, සුදුසු පරිදි නඩුපැවරීමට නීතිවේදීන්ට උදවු කිරීම වේ.

---

[1] මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයාගේ කාර්යාලය, 'මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 70: වගන්ති 30 පිළිබඳ ලිපි 30 –වගන්තිය18', https://www.ohchr.org/en/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=23938&LangID=E.

[2] මානව හිමිකම් කවුන්සිලය, 'ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව' (23 දෙසැම්බර්2015) UN DOC A/HRC/31/18.

[3] වෙරිටෙ රිසර්ච් සහ ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය, 'Inaction and Impunity: Incidents of Religious Violence Targeting Christians, Muslims and Hindus, 2015-2019', at https://06c0dd8b-b6f3-41c4-99aa-25915d2024cf.filesusr.com/ugd/ff89a1_9c2ad191e3714fe491cf0ac1228452fc.pdf.

[4] එම. පි. 6.

මෙම අත්පොත, ප්‍රධාන කොටස් පහකින් යුතුව සකසා තිබේ. පළමු කොටසින් මෙම අත්පොතෙන් ආවරණය කෙරෙන විෂයපථය පැහැදිලි කර දෙයි. එනම්, FoRB නඩුවක් ලෙස සැලකිය හැක්කේ කුමක්ද යන්නයි. දෙවන කොටසින්, නීතිමය රාමුව, එනම්, ශ්‍රී ලංකාවේ FoRB රාමුව තුළ අදාළ වන ප්‍රධාන නෛතික විධිවිධාන, යොමුවීමේ පහසුව තකා මෙහි දක්වා තිබේ. තුන්වන කොටසින් FoRB නඩුකරයකට සූදානම්වීමේදී සහ තමන්ගේ සේවාදායකයාව නියෝජනය කිරීමේදී නීතිවේදීන් විසින් තිබෙන්නේ දැයි පරීක්ෂා කළයුතු සහ ලබාගත යුතු තොරතුරු සහ සාක්ෂි වර්ග සම්බන්ධයෙන් පොදුවේ සූදානම්වීමේ මගපෙන්වීමක් ලබාදෙයි. යම් යම් වර්ගවලට අයත් FoRB නඩු සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය හතරවන කොටසින් විස්තර කෙරේ. සමාප්ති කොටස, යම් නඩුවකට අදාළව මාධ්‍ය සමගින් කටයුතු කළයුතු ආකාරය පිළිබඳ මගපෙන්වීම් ලබාදෙයි.

# FORB උල්ලංඝනයක් හඳුනාගන්නේ කෙසේද?

## 1. FoRB උල්ලංඝනයක් හඳුනාගන්නේ කෙසේද?

පහත දැක්වෙන නිර්ණායක සපුරාලන අවස්ථාවලදී ගන්නා නෛතික ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මෙම අත්පොතෙන් මගපෙන්වනු ලැබේ. මෙම නිර්ණායක සම්පාදනය කර ඇත්තේ ඒවාට අදාළවන ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් මත පදනම් වෙමිනි.[5]

අ. ඇතිව තිබෙන තත්වය, පහත දැක්වෙන ගැටළු අතරින් එකකට අදාළව ඇතිවූවක් විය යුතුය:

1) ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතියේ යම් අංශයක් උල්ලංඝනය වීම; **සහ**
2) ආගමික අනන්‍යතාවය මත වෙනස්කොට සැලකීම; **හෝ**
3) ආගමික අනන්‍යතාවය මත ප්‍රචණ්ඩත්වය.

(1) **ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතියේ අංශ අතරට පහත ඒවා ඇතුළත් වේ:**

අ. තමන් කැමති ආගමක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස

ආ. වන්දනා කිරීම, පිළිපැදීම, ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම හරහා තමන්ගේ ආගම ප්‍රකාශ කිරීමේ නිදහස

පැහැදිලිතාවය උදෙසා, 'වන්දනා කිරීම, පිළිපැදීම, ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම' සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඇතුළත් වන වන බව මෙහි දක්වනු ලැබේ. ඊට ඇතුළත්විය හැකි තවත් ක්‍රියාකාරකම් ද තිබිය හැක.[6]

i. *වන්දනා කිරීම:* තමන්ගේ විශ්වාසය සෘජුවම ප්‍රකාශය කෙරෙන පූජාවිධි සහ චාරිත්‍රමය ක්‍රියා මෙන්ම ආගමික ස්ථාන ඉදිකිරීම, පූජාමය සූත්‍ර හා ද්‍රව්‍ය භාවිතය, සංකේත ප්‍රදර්ශනය, හා නිවාඩුදින සහ විවේක දින පිළිපැදීම ඇතුළු එම ක්‍රියා සඳහා අත්‍යවශ්‍ය විවිධ ප්‍රගුණ කිරීම් ද ඇතුළත් වේ.

ii. *පිළිපැදීම සහ ප්‍රගුණ කිරීම:* චාරිත්‍රමය ක්‍රියා පමණක් නොව ආහාරපාන පරිභෝජනය නියාමනය කිරීම, විශේෂිත ඇඳුම් හෝ හිස ආවරණ ඇඳීම, ජීවිතයේ යම් යම් අවධි සමගින් බැඳුනු චාරිත්‍ර සඳහා සහභාගිවීම, සහ සාම්ප්‍රදායිකව යම් කණ්ඩායමක් හා බැඳී ඇති භාෂාව කථා කිරීම යනාදී සිරිත්විරිත් ද ඇතුළත් වේ.

iii. *ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම:* තමන්ගේ ආගමික නායකයින්, පූජකවරුන් සහ ගුරුවරුන් තෝරා ගැනීමේ නිදහස, සෙමනේරි හෝ ආගමික පාසල් පිහිටුවීමේ නිදහස සහ ආගමික ග්‍රන්ථ හෝ ප්‍රකාශන සකස් කර බෙදා හැරීමේ නිදහස වැනි ආගමික කණ්ඩායම් විසින් ඔවුන්ගේ මූලික කටයුතුවල හැසිරීමට අත්‍යවශ්‍ය ක්‍රියා ඇතුළත් වේ.

මේ සංකල්ප අතරේ අන්තර්ඡේදනයවීම් පවතින බව පැහැදිලි ය. විශේෂයෙන්ම වන්දනා කිරීම සහ ප්‍රගුණ කිරීම අතරේ ද, ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම අතරේ එවන් අන්තර්ඡේදනයවීම් ඇත.

මෑතක දී කරුවලගස්වැව විදානෙලාගේ ස්වර්ණා මංජුලා සහ තවත් අය එදිරිව කැකිරාව පොලිස් ස්ථානාධිපති පුෂ්පකුමාර සහ තවත් අය (යොහෝවාගේ සාක්ෂිකරුවන්ගේ නඩුව)[7] නඩුවේ දී, ආගම

---

[5] මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 18 වැනි වගන්තිය; සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 18 වැනි වගන්තිය; ආගම හෝ විශ්වාසය මත පදනම් වූ සියලු ආකාරයේ නොඉවසීම සහ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ ප්‍රකාශයේ 1 වන වගන්තිය; මානව හිමිකම් පිළිබඳ යුරෝපීය සම්මුතියේ 9 වැනි වගන්තිය බලන්න.
[6] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව, 'පොදු අදහස් අංක 22 – 18 වැනි වගන්තිය (සිතීමේ, හෘදය සාක්ෂියේ හෝ ආගමික නිදහස)' (30 ජූලි 1993),CCPR/C/21/Rev.1/Add.4, para 4.
[7] SC (F.R) No. 241/14. ගෙහාන් ගුණතිලකගේ 'The Jehovah's Witnesses Case' බලන්න, (2020) 25 *The Bar Association Law Journal* 440.

ප්‍රචාරය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඉ) ව්‍යවස්ථාවෙන් ආරක්ෂා වූ විෂයපථයට ඇතුළත් නොවන බව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරන ලදී. [8]

(2) **වෙනස්කොට සැලකීමට** සමාජ-ආර්ථික වෙනස්කොට සැලකීම (එනම්, යම් යම් ආර්ථික ක්‍රියාකාරකම්වල නිරතවීම තහනම් කිරීම හෝ වෙළඳපලේ සහභාගීත්වය තහනම් කිරීම), දේශපාලන වෙනස්කොට සැලකීම (උදා: ප්‍රසිද්ධ රැස්වීම් තහනම් කිරීම), සහ නීතිය අදාළ කරගැනීමේදී සිදුකෙරෙන වෙනස්කොට සැලකීම (උදා: සාපරාධී නීතිය වෙනස්කොට සලකනසුළු අන්දමින් අදාළ කරගැනීම) ඇතුළු අංශ පරාසයක්ම ඇතුළත් විය හැකිය. නඩුවට අදාළ වන වෙනස්කොට සලකනසුළු ක්‍රියාව, යම් පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක ආගමික අනන්‍යතාවය සෘජුවම හෝ වක්‍රාකාරයෙන් ඉලක්ක කර තිබිය යුතු ය.

(3) **ප්‍රචණ්ඩත්වයට** ශාරීරික (උදා: ඝාතන, පහරදීම්, සහ දේපළ විනාශය) හෝ ශාරීරික-නොවන (උදා: තර්ජන, බියවැද්දීම්, බලාත්කාරය) ක්‍රියා ඇතුළත් විය හැක. නඩුකරයට අදාළ වන ප්‍රචණ්ඩ ක්‍රියාව යම් පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක ආගමික අනන්‍යතාවය සෘජුවම හෝ වක්‍රාකාරයෙන් ඉලක්ක කර තිබිය යුතු ය. යම් ආගමික අනන්‍යතාවයක් සහිත පුද්ගලයකුට ප්‍රචණ්ඩත්වය එල්ලවූයේ එම තැනැත්තාගේ ආගමික අනන්‍යතාවය **හේතුවෙන් නොවේ** නම්, එය මේ සඳහා අදාළ නොවේ.

ආ. නඩුකරය ශ්‍රී ලංකාවේ අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් වෙත ඉදිරිපත් කළ යුතු ය. සාමාන්‍යයෙන් නඩු මහේස්ත්‍රාත් අධිකරණයක්, මහාධිකරණයක්, අභියාචනාධිකරණයක් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් වේ.

[8] මේ නඩුව පිළිබඳ වඩාත් පුළුල් විශ්ලේෂණයක් සඳහා NCEASL හි ' e-portal හි FoRB නඩු විශ්ලේෂණය' බලන්න.

# වැදගත් නීතිමය විධිවිධාන

## 2. වැදගත් නීතිමය විධිවිධාන

ශ්‍රී ලංකාවේ FoRB සම්බන්ධයෙන් පවතින ප්‍රධාන නෛතික විධිවිධාන හෝ ඒ සඳහා බලපෑමක් ඇති නෛතික විධිවිධාන මෙම කොටසින් සාරාංශ කර දක්වනු ලැබේ.

| නීතිය | වගන්තිය | සවිස්තරාත්මක වගන්තිය |
|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** | 10 වැනි ව්‍යවස්ථාව | සෑම තැනැත්තෙකුටමම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහස්ට හෘද සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේය[9] |
| | 12 වැනි ව්‍යවස්ථාව | නීතිය පසිඳලීම සහ ක්‍රියා ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය යනුවෙන් 12 (1) ව්‍යවස්ථාවේ දැක්වේ.<br><br>කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හෝ හේතුවක් මත හෝ වෙනස්කම්කට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය යනුවෙන් 12 (2) ව්‍යවස්ථාවේ දැක්වේ.<br><br>වර්ගය, ආගම, භාෂාව, කුලය, හෝ ස්ත්‍රීපුරුෂ භේදය යන හේතු මත... හෝ ඉන් කවර හේතුවක් මත... තම තමාගේ ආගමට අයත් පොදු වූ පූජනීය ස්ථානවලට ඇතුළු වීම... සම්බන්ධයෙන් යම් අශක්නුතාවයකට බැඳීමකට, සීමා කිරීමකට නැතහොත් කොන්දේසියකට කිසිම තැනැත්තෙක් යටත් නොවන්නේය යනුවෙන් 12 (3) ව්‍යවස්ථාවේ සඳහන් වේ |
| | 14 (1) (ඉ) ව්‍යවස්ථාව | එකලාව හෝ අන් අය සමග ප්‍රසිද්ධියේ හෝ පුද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන් පිළිපැදීමෙන් ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට සෑම පුරවැසියකුටම හිමිකම ඇත්තේය |
| | 15 (7) ව්‍යවස්ථාව | 12 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 (1)(ඉ) වැනි ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති මූලික මූලික අයිතිවාසිකම්<br>15(7) ව්‍යවස්ථාවේ හඳුනාගෙන ඇති යම් යම් හේතු මත සීමා කිරීමට හැකිය. අනෙකුත් කරුණු ද ඇතුළුව, 12 වැනි සහ 14වැනි ව්‍යවස්ථාවල ඇතුළත් වන අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක විය හැක්කේ ද, 'රාජ්‍ය ආරක්ෂාව ද රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත් මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත් අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වග |

[9] ශ්‍රේෂ්ඨාධිකරණය ආගමික නිදහස පරම අයිතියක් ලෙස පිළිගත්තේ ප්‍රේමලාල් පෙරේරා එදිරිව වීරසූරිය [1985] 2 ශ්‍රී. L.R 177. නඩුවේදී ය. එම තීන්දුවේ 192 පිටුවේ උසාවිය මෙසේ දැක්විය: 'ආගම තුළ මුල් බැසගත් විශ්වාසයන් ආරක්ෂා කර ඇත. ආගමික විශ්වාසයක් ආරක්ෂා කිරීම සඳහා එම විශ්වාසය තාර්කික, පිළිගත හැකි, ස්ථාවර හෝ තේරුම් ගත හැකි වීම අවශ්‍ය නොවේ. අදාළ හිමිකම් පෑම අමුතු සහ පැහැදිලිවම ආගමික නොවන අභිප්‍රේරණයක් සඳහා නොවන්නේ නම්, ආරක්ෂාව අපේක්ෂා කරන පුද්ගලයා ඔහුගේ විශේෂිත ඇදහිල්ලෙන් නියම කර ඇති ආඥා නිවැරදිව වටහාගෙන ඇත්දැයි විමසීම අධිකරණ කාර්යයට සහ අධිකරණ හැකියාවට අයත් නොවේ. උසාවි යනු ශුද්ධ ලියවිලිවල අර්ථනිරූපණය සම්බන්ධයෙන් බේරුම්කරුවන් නොවන අතර ආගමික විශ්වාසයන් විශ්ලේෂණය කිරීමට කටයුතු නොකළ යුතුය.

| | | |
|---|---|---|
| | | බලා ගැනීම පිණිසත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය සඳහා යුක්ති සහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්ව' වන බව මෙම විධිවිධානයේ සඳහන් වේ. |
| | 27 ව්‍යවස්ථාව | 27(5) ව්‍යවස්ථාව: වාර්ගික, ආගමික, විවිධ භාෂා භාවිත කරන සහ වෙනත් ජන කොට්ඨාස ඇතුළු ශ්‍රී ලංකාවාසී සකල ජනතාව අතර සහයෝගය සහ අන්‍යොන්‍ය විශ්වාසය වඩාලීමෙන් ජාතියේ සමගිය තහවුරු කිරීම ද විශේෂ සැලකිලි සහ වෙනස්කම් තුරන් කිරීම සඳහා ඉගැන්වීම, අධ්‍යාපනය දීම සහ ප්‍රවෘත්ති සැපයීම යන ක්ෂේත්‍රවල ඵලදායී පියවර ගැනීම ද රජය විසින් කළ යුත්තේ ය.<br><br>27(6) ව්‍යවස්ථාව: කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රීපුරුෂ භේදය, දේශපාලන මතය හෝ රැකියාව හේතුවෙන් යම්කිසි අශක්නුතාවකට පත් නොවන පරිදි පුරවැසියන්ට දියුණුවීමට සම ප්‍රස්ථාවන් සැලසීමට රජය වගබලා ගත යුත්තේ ය.<br><br>27(11) ව්‍යවස්ථාව: ආගමක් අදහන කවරකු හට වුව ද, ස්වකීය ආගමික ප්‍රතිපත්ති සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය ආර්ථික සහ සමාජ පරිසරය රජය විසින් ඇතිකළ යුත්තේ ය. |
| **1883 අංක 2 දරන දණ්ඩනීති සංග්‍රහ ආඥාපනත (සංශෝධිත)** | 290 වගන්තිය<br><br>යම් පිරිසකගේ ආගමට අපහාස කිරීමේ අදහස ඇතිව ආගමික ස්ථානයකට හානි කිරීම හෝ කෙලෙසීම | යම් පංතියක තැනැත්තන්ගේ ආගමට නින්දාවක් කරන අදහසින් හෝ විනාශ කිරීම, හානි කිරීම හෝ කෙලෙසීම, යම් පංතියක තැනැත්තන් විසින් තමන්ගේ ආගමට කරන ලද නින්දාවක් ලෙස සැලකිය හැකි බව දනිමින්ම, යම් පංතියක තැනැත්තන් විසින් ශුද්ධ ලෙස සලකනු ලබන පූජනීය ස්ථානයක් හෝ ද්‍රව්‍යයක් යමකු විනාශ කරන්නේ නම් හෝ එවැන්නකට හානි කරන්නේ නම් හෝ කෙලෙසන්නේ නම් ඔහුට අවුරුදු 02 දක්වා කාලයක් බන්ධනාගාරගත කිරීම හෝ දඩ නියම කිරීම හෝ ඒ දෙකම යන දඬුවම් නියම කළ යුතුය. |
| | 290A වගන්තිය<br><br>යම් පිරිසකගේ ආගමට අපහාස කිරීමේ අදහස ඇතිව ආගමික ස්ථානයකට අදාළව සිදුකෙරෙන ක්‍රියා | යම් පංතියක තැනැත්තන්ගේ ආගමික හැඟීම්වලට රිදවීමේ අදහසින් හෝ තම ආගමට නින්දාවක් ලෙස යම් පංතියක තැනැත්තන් විසින් සලකනු ලැබිය හැකි බව දනිමින්ම, යම් පංතියක තැනැත්තන් විසින් ශුද්ධ ලෙස හෝ ගෞරවණීය ලෙස සලකන යම් පූජනීය ස්ථානයකට හෝ ද්‍රව්‍යයකට, එය තුළ හෝ එය මත හෝ එය ආසන්නයේ, යම් ක්‍රියාවක් කරන තැනැත්තකුට අවුරුද්දක් දක්වා සිරදඬුවම් හෝ දඩ නියම කිරීම හෝ ඒ දෙකම යන දඬුවම් නියම කළ යුතුය. |
| | 291 වගන්තිය<br><br>ආගමික රැස්වීම්වලට බාධා කිරීම. | ආගමික වැඳුම් පිදුම් කිරීමක හෝ ආගමික පූජාවන්හි නීති ප්‍රකාරව යෙදී සිටින යම් රැස්වීමකට ස්වකැමැත්තෙන්ම බාධා කරන තැනැත්තෙකුට දෙවර්ගයෙන් කවර හෝ වර්ගයක සිරදඬුවම් අවුරුද්දක් දක්වා නියම කිරීම හෝ දඩ නියම කිරීම හෝ ඒ දෙකම යන දඬුවම් නියම කළ යුතුය. |

| | | |
|---|---|---|
| | 291A වගන්තිය<br><br>ආගමික හැඟීම්වලට රිදවීමේ අදහස ඇතිව සිතාමතාම යම් වදන් පැවසීම. | යම් තැනැත්තෙකුගේ ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත අදහසින්, සිතාමතාම, එකී තැනැත්තාට ඇසෙන ලෙස යමකු යම් වචනයක් කියතොත් හෝ ශබ්දයක් කළහොත් හෝ එකී තැනැත්තාට පෙනෙන සේ යම් සංඥාවක් කරතොත් හෝ එකී තැනැත්තා ඉදිරියෙහි යම් ද්‍රව්‍යයක් තබතොත් ඔහුට දෙවර්ගයෙන් කවර හෝ වර්ගයක සිරදඬුවම් අවුරුද්දක් දක්වා නියම කිරීම හෝ දඩ නියම කිරීම හෝ ඒ දෙකම යන දඬුවම් නියම කළ යුතුය. |
| | 291B වගන්තිය<br><br>යම් පිරිසකගේ ආගමට හෝ ආගමික විශ්වාසවලට අපහාස කිරීම හරහා ඔවුන්ගේ ආගමික හැඟීම් කුපිත කිරීමට සිතාමතාම සහ ද්වේශසහගතව කරනු ලබන ක්‍රියා. | යම් පංතියක තැනැත්තන්ගේ ආගමික හැඟීම් කුපිත කිරීම සඳහා සිතාමතාම හා ද්වේශ සහගත අදහසින් භාෂිත හෝ ලිඛිත වචනයෙන් හෝ දෘෂ්‍ය නිරූපණවලින් එකී පංතියේ ආගමට හෝ ආගමික විශ්වාසවලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත්කරන තැනැත්තෙකුට දෙවර්ගයෙන් කවර හෝ වර්ගයක සිරදඬුවම් අවුරුදු දෙකක කාලයක් දක්වා නියම කිරීම හෝ දඩ නියම කිරීම හෝ ඒ දෙකම යන දඬුවම් නියම කළ යුතුය. |
| | 292 වගන්තිය<br><br>භූමදාන ස්ථානවලට අනවසරයෙන් ඇතුළුවීම | යම් තැනැත්තකුගේ හැඟීම්වලට රිදවනු පිණිස හෝ යම් තැනැත්තකුගේ ආගමට නින්දා කිරීම පිණිස හෝ යම් තැනැත්තකුගේ හැඟීම්වලට රිදවිය හැකිබව හෝ යම් තැනැත්තකුගේ ආගමට නින්දා වියහැකි බව දනිමින්ම යම් වැඳුම්පිදුම් කරන ස්ථානයකට හෝ සුසානභූමිකයට හෝ අවමංගල චාරිත්‍ර පැවැත්වීම සඳහා හෝ මියගිය තැනැත්තන් තැන්පත් කිරීම සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයකට බලෙන් යමකු ඇතුළු වෙතොත් හෝ මළකඳකට අගෞරවයක් කරතොත් හෝ අවමංගල චාරිත්‍ර ඉෂ්ඨ කිරීම සඳහා රැස්වී සිටින තැනැත්තන්ට බාධා කරතොත් ඔහුට අවුරුද්දක් දක්වා සිරදඬුවම් හෝ දඩ නියම කිරීම හෝ ඒ දෙකම යන දඬුවම් නියම කළ යුතුය. |
| | 483 වගන්තිය<br><br>සාපරාධී බියගැන්වීම | යමෙක් විසින්, තැති ගැන්වීමක් ඇතිකරවන අදහසින් හෝ තර්ජනය ක්‍රියාත්මක කරවීම වැලැක්වීමේ මාර්ගයක් වශයෙන් තමා නීත්‍යානුකූලව කිරීමට බැඳී නැති ක්‍රියාවක් කරවීමට හෝ තමාට නීත්‍යානුකූලව කිරීමට බලය ඇති යම් ක්‍රියාවක් නොකර හැරවීමට යමකු යම් තැනැත්තකුගේ ශරීරයට හෝ දේපළවලට හෝ ඔහු සම්බන්ධතාවයක් දක්වන වෙනත් තැනැත්තකුගේ ශරීරයට හෝ කීර්තියට පාඩුවක් කරන බවට තර්ජනය කිරීම |
| **1865 අංක 16 දරන පොලිස් ආඥාපනත (සංශෝධිත)** | 79(2) වගන්තිය | සාමය කඩ කිරීම අරමුණු කරගෙන හෝ එකී ක්‍රියාවෙන් සාමය කඩවීමට බොහෝදුරකට ඉඩ ඇති කල, ප්‍රසිද්ධ ස්ථානයක හෝ ප්‍රසිද්ධ රැස්වීමක එසේ තර්ජනාත්මක, නින්දා සහගත හෝ අවමන්සහගත වචන හෝ හැසිරීම් යොදාගන්නා ඕනෑම පුද්ගලයකු මෙම වගන්තිය යටතේ වරදක් සිදුකළ බව සලකනු ලැබේ. |
| | 81 වගන්තිය | යම් මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත දී යම් තැනැත්තකු වෙසින් සාමය කඩ කරනු ලැබීමට |

| | | |
|---|---|---|
| **1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය (සංශෝධිත)** | | හෝ සාමය කඩවීමක් සිදුවිය හැකි යම් වැඩදි ක්‍රියාවක් කිරීමට ඉඩ ඇති තැනැත්තකු ඒ බල සීමාව ඇතුළත සිටින බවට ඒ මහේස්ත්‍රාත්වරයාට තොරතුරු ලැබුණු කවර විටක වුව ද, නියම කිරීම සුදුසු යැයි අධිකරණය කල්පනා කරන සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාල සීමාවක් තුළ සාමය ආරක්ෂා කිරීම සඳහා ඇප ඇතිව හෝ නැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරන ලෙස ඒ තැනැත්තා වෙත ආඥා කරනු නොලැබීමට හේතු තිබේ නම් ඒ හේතු දක්වන ලෙස ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට මෙහි මින් පසු සකස්වනු ලබන විධිවිධානවල සඳහන් ආකාරයෙන් නියම කරනු ලැබිය හැකිය. |
| | 98 (1) වගන්තිය<br><br>පීඩා ඉවත්කිරීම පිණිස කොන්දේසි සහිත ආඥාවක් කිරීම | මහේස්ත්‍රාත්වරයකු වෙත වාර්තාවක් හෝ වෙනත් තොරතුරක් ලැබුණු විට හා සුදුසු යැයි ඔහු කල්පනා කරන සහ සාක්ෂි කිසිවක් වෙතොත් ඒ සාක්ෂි සටහන් කර කර ගැනීමෙන් පසුව<br>අ) මහජනයා විසින් නීත්‍යානුකූලව ප්‍රයෝජනයට ගනු ලබන හෝ ගනු ලැබිය හැකි යම් මාර්ගයකින්, වරායකින්, විලකින්, ගංගාවකින් හෝ ඇලකින්, යම් පොදු ස්ථානයකින් නීත්‍යානුකූල නොවන යම් බාධකයක් හෝ පීඩාවක් ඉවත් කළ යුතු යැයි<br>හෝ<br>ආ) යම් කර්මාන්තයක් හෝ ව්‍යාපෘතියක් හෝ යම් භාණ්ඩ හෝ වෙළඳ භාණ්ඩ තබා ගැනීමක් එය මහජනයාගේ සෞඛ්‍යයට හෝ කායික සුවයට හානි කරවීමේ හේතුව නිසා මැඩ පැවැත්විය යුතු යැයි හෝ ඉවත් කළ යුතු යැයි හෝ තහනම් කළ යුතුය යැයි<br>හෝ<br>ඇ) යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ යම් ද්‍රව්‍යයක් බැහැර කිරීම නිසා ගින්නක් හෝ පිපිරීමක් ඇති වීමට ඉඩ තැබීම් හේතුකොට හේතු කොටගෙන ඒ ඉදිකිරීම් හෝ බැහැර කිරීම් වැළැක්විය යුතුයැයි හෝ නතර කළ යුතු යැයි<br>හෝ<br>ඇ) යම් ගොඩනැගිල්ලක් හෝ ගසක් කඩා වැටී ඒ අවට ජීවත්වන හෝ ව්‍යාපාර කටයුතු කරන හෝ ඒ ස්ථානය පසුකර ගෙන යන තැනැත්තන්ට එමගින් හානි සිදුවීමට ඉඩ ඇති තත්වයක ඒ ගොඩනැගිල්ල හෝ ගස පවතින බැවින් ඒ ගොඩනැගිල්ල ඉවත් කිරීම අළුත්වැඩියා කිරීම හෝ එයට මුක්කු ගැසීම හෝ ගස ඉවත් කිරීම හෝ එයට මුක්කු ගැසීම අවශ්‍යයයි<br>හෝ<br>ඉ) එවැනි යම් මාර්ගයකට හෝ පොදු ස්ථානයකට යාබදව යම් වැවකින්, ළිඳකින් හෝ වළකින් මහජනයාට ඇති විය හැකි අනතුරු වැළැක්වෙන ආකාරයෙන් ඒ වැව, ළිඳ හෝ වල වටා වැටක් ඉදි කළ යුතු යැයි<br><br>ඒ මහේස්ත්‍රාත්වරයා සලකන කවර විටෙක වුවද ඒ මහේස්ත්‍රාත්වරයා විසින් කොන්දේසි සහිත ආඥාවක් කිරීමෙන් ඒ බාධකය හෝ පීඩාව කරන කර්මාන්තය හෝ ව්‍යාපෘතිය කරගෙන යන හෝ එවැනි යම් භාණ්ඩ හෝ වෙළඳ භාණ්ඩ තබා තබා ගෙන සිටින හෝ ඒ ගොඩනැගිල්ල, ද්‍රව්‍ය, ගස, වැව, ළිඳ, හෝ වල අයිති ව සිටින, සිය සන්තකයේ තබාගෙන සිටින, හෝ පාලනය කරන තැනැත්තා විසින් කොන්දේසි සහිත නියම කරනු ලබන කාලයක් ඇතුළත -<br>i) ඒ බාධකය හෝ පීඩා වූ ඉවත් කළ යුතු යැයි හෝ<br>ii) ඒ කර්මාන්තය හෝ ව්‍යාපෘතිය මැඩ පැවැත්විය යුතු යැයි හෝ<br>iii) ඒ භාණ්ඩ හෝ වෙළඳ භාණ්ඩ ඉවත් කළ යුතු යැයි<br>හෝ<br>iv) ඒ ගොඩනැගිල්ල ඉදි කිරීම වැළැක්විය යුතුයැයි හෝ නතර කළ යුතුය යැයි හෝ<br>v) එය ඉවත් කළ යුතුය යැයි හෝ අලුත් අලුත්වැඩියා කළ යුතු යැයි හෝ එයට මුක්කු ගැසිය යුතු යැයි හෝ<br>vi) ඒ ද්‍රව්‍ය බැහැර කිරිම වෙනස් කළ යුතු යැයි හෝ<br>vii) ඒ ගස් ඉවත් කළ යුතු යැයි හෝ |

| | | |
|---|---|---|
| | | viii) අවස්ථාවෝචිත පරිදි ඒ වැව, ළිඳ හෝ වල වටා වැටක් ඉදි කළ යුතුය යැයි හෝ<br>අණ කරනු ලැබිය හැකි ය. |
| **1970 අංක 44 දරණ ප්‍රාථමික අධිකරණ කාර්ය පටිපාටිය (සංශෝධිත)** | 66 (1) වගන්තිය (VII කොටසේ සාමය කඩවීමක් වියහැකි ඉඩම් සම්බන්ධ ආරවුල් විමර්ශනය යටතේ) | 1. ඉඩම්වලට බලපාන ආරවුලක් නිසා සාමය කඩවීමේ තර්ජනයක් එල්ලවී ඇති හෝ සාමය කඩවීමට ඉඩ ඇති හෝ කවර විටෙක වුවද අ) ඒ ආරවුල පිළිබඳ පරීක්ෂණයක් පවත්වන පොලිස් නිලධාරියා විසින්<br>i) ඒ ඉඩම පිහිටියේ යම් ප්‍රාථමික අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද ඒ ප්‍රාථමික අධිකරණය වෙත ඒ ආරවුල සම්බන්ධයෙන් තොරතුරු වාර්තාවක් හැකිතාක් අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු අතර ඒ තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ දිනයට ඉක්බිතිව ම එළඹෙන්නා වූ ද අධිකරණය ඊළඟට රැස් වන්නාවූ ද දිනයෙහි ඒ ප්‍රාථමික අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින බවට වූ බැඳුම්කරයකට ඇතුළත් වන ලෙස ඒ ආරවුලට සම්බන්ධ එක් එක් පාර්ශවකරුට නියම කළ යුතුය; නැතහොත්<br>ii) සාමය ආරක්ෂා කිරීමෙහි ලා අවශ්‍ය වන්නේ නම් ආරවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් සිරභාරයට ගෙන ඉඩම පිහිටා ඇත්තේ යම් ප්‍රාථමික අධිකරණයක අධිකරණ බල සීමාව තුළ ද ඒ ප්‍රාථමික අධිකරණය විසින් ඔවුන් සම්බන්ධයෙන් නීතිය අනුව ක්‍රියා කරනු ලැබීම පිණිස ඔවුන් නොපමාව ඒ අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු අතර ඔහු විසින් ඒ අවස්ථාවේදීම එය ආරවුල සම්බන්ධයෙන් තොරතුරු වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය; නැතහොත්<br><br>ආ) ඒ ආරවුලට සම්බන්ධ යම් පාර්ශවකරුවකු විසින් ඒ පිළිබඳ සිද්ධි සහ තමන් ඉල්ලා සිටින සහනය දක්වමින් සහ වගඋත්තරකරුවන් වශයෙන් ආරවුලට සම්බන්ධ අනෙක් පාර්ශවකරුවන්ගේ නම් සහ ලිපිනයන් සඳහන් කරමින් දිවුරුම් පත්‍රයක් මගින් තොරතුරු වාර්තාවක් ඒ ප්‍රාථමික අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවිට එය අධිකරණය විසින් අධිකරණයේ ක්‍රියා පිළිවෙළ අනුව හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ දැන්වීමක් යවමින් දැන්වීමෙහි සඳහන් දිනයෙහි ඒ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස යටකී නම් කරනු ලැබූ පාර්ශ්වකරුවන්ට දැනුම් දිය යුතුය ඒ දිනය තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ දින සිට සති දෙකක් නොඉක්මවන දිනයක් විය යුතුය |
| **2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) පනත** | 3(1) වගන්තිය | කිසිම පුද්ගලයෙක් යුද්ධය ප්‍රචාරය කිරීම හෝ වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වය සඳහා උසිගැන්වීමක් වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී නොසිටිය යුතුය. |
| **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, 1979 අංක 48 (PTA)** | 2(1)(h) වගන්තිය | කියනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මගින් හෝ සංඥා මගින් හෝ දෘෂ්‍ය නියෝජනය මගින් හෝ අන්‍යාකාරයකින් සාහසික ක්‍රියා විවිධ ජන කොටස් නැතහොත් වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික, වර්ගීය නැතහොත් ජාතිවාදී අසංගතිය නැතහොත් දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇතිවීමට අදහස් කරන්නා වූ... යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. |
| | | |

| | | |
|---|---|---|
| | 14(2)(a)(ii) වගන්තිය | සාහසික ක්‍රියාවලට පෙළඹවීමට හෝ ආගමික, වාර්ගික හෝ ජාතිවාදී අසංගතිය නැතහොත් විවිධ ජනකොටස් අතර දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති කිරීමට තුඩු දෙන පෙළඹවීම්වලට... අදාළ යම් කාරණයක් යම් ප්‍රවෘත්ති පත්‍රයක මුද්‍රණය කිරීම හෝ පළ කිරීම හෝ කරනු නොලැබිය යුතු ය. |
| **1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (සංශෝධිත)** | 5(f) වගන්තිය | 4 වගන්තියේ දැක්වෙන අරමුණු සාක්ෂාත් කරගැනීමේ කාර්යය සඳහා අධිකාරියට පහත බලතල පැවරේ...<br>(f) ජාතික ආරක්‍ෂාව, මහජන සාමය සහ රටේ ආරක්‍ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විසින් කලින් කලට ලබා දිය හැකි ඕනෑම සාමාන්‍ය හෝ විශේෂ විධානයකට අනුකූලව නියම කළ හැකි නියාමන ක්‍රියාමාර්ග ගැනීමට. |
| | 58 වගන්තිය<br><br>අසභ්‍ය හෝ අශෝභන හෝ රාජද්‍රෝහී පණිවිඩ ඉදිරිපත් කිරීම සඳහා දඬුවම් | තමා විසින්ම හෝ තම නියෝජිතයා හෝ සේවකයා විසින් කිසියම් විදුලි සංදේශ කාර්යාලයකට අශෝභන, අසභ්‍ය, දේශද්‍රෝහී, නින්දිත, තර්ජනාත්මක හෝ දරුණු ලෙස පිළිකුල් සහගත ස්වභාවයේ පණිවිඩයක්, සම්ප්‍රේෂණය කිරීම සඳහා භාරදෙන සෑම පුද්ගලයෙකුම, වරදකට වැරදිකරු වන අතර, වරදකට වරදකරු වීම මත රුපියල් පන්දහසකට නොවැඩි දඩයක් හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා සිරදඬුවමක් හෝ එවැනි දඩයක් සහ එවැනි සිරදඬුවමක් යන දෙකටම ලක්විය හැකිය |
| | 69 වගන්තිය<br><br>විදුලි සංදේශ භාවිතය තහනම් කිරීමට හෝ සීමා කිරීමට රජය සතු බලය | කිසියම් මහජන හදිසි අවස්ථාවකදී හෝ මහජන ආරක්ෂාව සහ සන්සුන්භාවය සඳහා, විදුලි සංදේශය මගින් පණිවිඩ සම්ප්‍රේෂණය කිරීම සහ පිළිගැනීම තහනම් කිරීම හෝ අධීක්‍ෂණයට සහ පාලනයට යටත් කිරීම යෝග්‍ය හෝ අවශ්‍ය නම්,<br>(අ) පොදුවේ හෝ කිසියම් නිශ්චිත පුද්ගලයකුට හෝ පුද්ගල පන්තියකට විදුලි සංදේශ මගින් පණිවිඩ සම්ප්‍රේෂණය කිරීම හෝ පිළිගැනීම තහනම් කිරීම සුදුසු හෝ අවශ්‍ය වන තැන්හි;<br>හෝ<br>(ආ) අධීක්ෂණය සහ පාලනය සුදුසු හෝ අවශ්‍ය වන තැන්හි,<br><br>ඉහත කරුණු පිළිබඳව සෑහීමකට පත්වේ නම්, අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක හෝ ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවේ ඕනෑම නෞකාවක හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඊට ඉහළින් ඇති ඕනෑම වාහනයක හෝ ගුවන් යානයක හෝ එහි මුහුදු සීමාව තුළ සපයනු ලබන ඕනෑම විදුලි සංදේශ සේවාවක් සම්බන්ධයෙන්, පොදුවේ සකස් කර ගැසට් පත්‍රයේ පලකරන හෝ විශේෂයෙන් ලිඛිතව කරන ලද නියෝගයකින්<br><br>(i) පොදුවේ හෝ කිසියම් නිශ්චිත විදුලි සංදේශ සේවාවක් භාරව සිටින ක්‍රියාකරුවෙකු හෝ පුද්ගලයෙකු විසින් විදුලි සංදේශ මගින් පණිවිඩ සම්ප්‍රේෂණය කළ හැකි හෝ ලැබීමට යටත් වන කොන්දේසි සහ සීමාවන් නියම කිරීම; හා<br>(ii) විදුලි සංදේශ මගින් සම්ප්‍රේෂණය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද, හෝ සම්ප්‍රේෂණය කරන ලද හෝ ලැබුණු පණිවිඩ සියල්ල හෝ කිසියම් නිශ්චිත පන්තියක් හෝ විස්තරයක් බාධා කිරීම හෝ වාරණය කිරීම සඳහා අවශ්‍ය යැයි ඔහු සිතන විධිවිධාන සම්පාදනය කිරීම කළ හැකිය. |
| | | |

| | | |
|---|---|---|
| **2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත** | 6 (1) වගන්තිය | යම් පරිගණකයකට හිතාමතා ම යම් කර්තව්‍යයක් ඉටු කිරීමට සැලැස්වීමෙන් සහ එයින් යම් හානියක් වන බව දනිමින් හෝ එසේ විශ්වාස කිරීමට කරුණු ඇති ව එයින්<br>(අ) ජාතික ආරක්ෂාවට<br>(ආ) ජාතික ආර්ථිකයට<br>හෝ<br>(ඇ) මහජන ආරක්ෂාවට<br>හානි සිදු කිරීමට සලස්වන්නා වූ යම් තැනැත්තකුට අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. |
| **1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල නීතිය (සංශෝධිත)** | 15 වගන්තිය | 1) යම් පුවත්පත්ක<br>අ) යම් අසභ්‍ය කරුණක් හෝ<br>ආ) දණ්ඩ නීති සංග්‍රහයේ 470 වගන්තියෙහි අර්ථානුකූලව යම් තැනැත්තෙකුට අපකීර්තියක් කරන ලෙස ගණන් ගැනෙන, ඒ තැනැත්තා පිළිබඳ යම් ප්‍රකාශයක් හෝ කරුණක් හෝ<br>ඇ) මහජන සදාචාරයට හානි කරවීමට අදහස් කරන ලද යම් වෙළඳ දැන් දැන්වීමක් හෝ<br>ඈ) යම් අශෝභන හෝ අශ්ශීල ප්‍රකාශයක් හෝ කරුණක්<br>පළකරන හෝ පළ කිරීමට සලස්වන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් 5000 කට නොවැඩි දඩයකින් හෝ අවුරුදු 2කට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකෙන්ම දඬුවම් කරනු ලැබීමට ඔහු යටත් විය යුතුය<br><br>2) වගන්තියේ මේ වගන්තියේ කාර්යයන් සඳහා<br>අ) අසභ්‍ය යන්නෙන්<br>i) යම් ආගමක් හෝ යම් ආගමක ආදී කතෘවරයා<br>ii) යම් ආගමක අනුගාමිකයන් විසින් පුදනු ලබන යම් දෙවිවරයකු හෝ සාන්තුවරයෙකු නින්දාවට පත් කිරීමේ අභිප්‍රාය වූ යම් කරුණක්ද අදහස් වේ. තවද;<br>ආ) අශෝභන හෝ අශ්ශීල ප්‍රකාශය හෝ කරුණ යන්නෙන්, අදාළ සියලු කරුණු සැලකිල්ලට ගත් කල්හි එම ප්‍රකාශය හෝ කරුණ කියවන හෝ බලන තැනැත්තෙකු කෙලෙළෙසීමට හෝ දූෂණයට පත් වීමට ඉඩ ඇති යම් ප්‍රකාශයක් හෝ කරුණක් අදහස් වන බව සැලකිය යුතුය |
| **1985 අංක 9 දරන සුසාන භූමි සහ භූමදාන ආඥාපනත** | 9 වගන්තිය | භූමදාන කිරීමේදී හෝ ආදාහන කිරීමේදී පවත්වනු ලබන ආගමික මෙහෙය සිදුකිරීම සඳහා, සුසානයේ සීමාව ඇතුළත පල්ලි ආදිය ගොඩනැංවීමට බලය දෙන්නට ඊට නිසි බලධරයාට හැකිය. |
| | 1 වගන්තිය | 1) කිසියම් ප්‍රසිද්ධ සුසානයක කවර කොටසක් වුවද, ඉදින් එය කිසියම් ආගමික නිකායක් මඟින් ඉල්ලා සිටි කල්හී එම ආගමික නිකායේ විශේෂ ප්‍රයෝජනය සඳහා ඒ විකුණන්නට නිසි බල බලධරයා ට හැකිය. විකුණන ලද කොටස මෙම ආඥා පනතේ අවශ්‍යතා සම්බන්ධයෙන් පමණක් යථෝක්ත භූමිය භාරව සිටින බලධරයා විසින් එබඳු ආගමික නිකායක් වෙනුවෙන් ඔප්පුවක් මඟින් එම කොටස පවරා දෙනු ලැබූ හෝ මෙයින් පසුව එම කොටස |

| | | |
|---|---|---|
| | | පවරා දෙනු ලබන පුද්ගලයා හෝ පුද්ගලයන්යින් කෙරෙහි පැවරී පවතින්නේය<br>2) සාමාජිකයින් තුන්දෙනෙක් හෝ වැඩි දෙනෙකුගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් පත්කිරීමට භාරකාර ලෙස ක්‍රියා කරන තැනැත්තාට හෝ තැනැත්තන්ට නීත්‍යානුකූලව ඉඩ ඇත්තේය එසේම එබඳු කොටසක් පිළිබඳව පහත දැක්වෙන බලතල ක්‍රියාවේ යෙදවීමට පාලක මණ්ඩලයට හෝ එහි සාමාජිකයින් බහුතරයට පුළුවන:<br>අ) ආරක්ෂකයකු ද මිනී වළවල් ද කිසියම් පොදු සුසානයක එබඳු කොටසක් පිළිබඳ ආරක්ෂාව හා ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වන වෙනත් සේවකයින්ද පත් කිරීමේ බලය,<br>ආ) එබඳු කොටසක කවර හෝ බිම් කට්ටියක වැළලීමේ විශේෂ අයිතිවාසිකමක් හෝ එහි එක් වැළලීමක් හෝ වැඩි ගණනක් කිරීමේ අයිතිවාසිකම හෝ කිසියම් මිනී වළක් මත සිහිවටනයක් හෝ සොහොන් ගලක් තැන්පත් කිරීමේ අයිතිවාසිකම, එබඳු කොටසක පිහිටි ගොඩනැගිල්ලක හෝ දේවස්ථානයක බිත්තිවල මරණ සටහනක් කිරීමේ කෙටීමේ අයිතිවාසිකම ප්‍රදානය කිරීමේ බලය,<br>ඇ) එබඳු කවර කොටසක වුවද ආදාහන කිරීම් තහනම් කිරීමේ බලය ද වෙයි |
| | 13 වගන්තිය | මියගිය කිසියම් පුද්ගලයකුගේ අන්තිම කැමති පත්‍රයක බූදල් බලකාරයකු විසින් ආරාධිතව හෝ මිය ගිය කිසියම් පුද්ගලයකුගේ මෘතදේහය භාරව සිටින සෙසු කිසියම් තැනැත්තකු විසින් ආරාධිතව හෝ ආගමික නිකායක පූජ්‍යයකු, ආගමික දේවගැතිවරයකු, පූජකයකු හෝ වෙනත් පුද්ගලයකුට ආගමික මෙහෙය සිදුකළ හැකිය. |
| **1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥාපනත (PSO) යටතේ හදිසි නීති රෙගුලාසි (ER)** | 5 වගන්තිය | මහජන ආරක්ෂාව සහ මහජන සාමය ආරක්ෂා කිරීම සහ කැරලි කෝලාහල හෝ සිවිල් කැලඹීම් මර්දනය කිරීම හෝ ප්‍රජාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය බව පෙනේ නම්, හදිසි නීති රෙගුලාසි සෑදීමට ජනාධිපතිවරයාට බලය ඇත. |
| **1987 3 දරණ නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ රෙගුලාසි (සංශෝධිත)** | 2 & 3 වගන්ති | COVID-19 වසංගතය සම්බන්ධ ගැටළු විසඳීම සඳහා රෙගුලාසි මාලාවක් නිකුත් කර ඇත. වසංගතය අඛණ්ඩව පැවතීම මත, මෙම රෙගුලාසි නිතිපතා සංශෝධනය වේ.[10] |

මීට අමතරව, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 2 වැනි වගන්තියට අනුව, වරදක් ' හඳුනා ගත හැකි වරදක්' ලෙස නම් කර ඇත්නම්, 'සාම නිලධාරියෙක්' (පොලිස් නිලධාරීන් සහ ග්‍රාම සේවා නිලධාරීන් මෙම සාම නිලධාරීන් වශයෙන් පොලිස් රාජකාරි ඉටු කිරීමට දිසාපති විසින් ලිඛිතව පත් කරනු ලැබේ) හට වරෙන්තුවක් නොමැතිව අපරාධකරුවන් අත්අඩංගුවට ගත හැකිය. වරදක් 'හඳුනා ගත නොහැකි' වරදක් ලෙස සලකන්නේ නම්, සාම නිලධාරියෙකුහට වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට නොගත හැකිය. 'සාමය කඩකිරීමේ අරමුණින් තර්ජනාත්මක,

[10] මෙම රෙගුලාසි පිළිබඳ වැඩිදුර විස්තර සඳහා රජයේ මුද්‍රණාලයේ අතිවිශේෂ ගැසට්පත්‍ර බලන්න: http://documents.gov.lk/en/exgazette.php

අපවාදාත්මක හෝ අපහාසාත්මක වචන හෝ හැසිරීම් භාවිත කිරීම' පොලිස් ආඥාපනතේ 79(2) වගන්තියට අනුව හඳුනාගත හැකි වරදකි.

**දණ්ඩ නීති සංග්‍රහයේ හඳුනාගත හැකි වරද වශයෙන් සඳහන් වන ඒවා අතරට පහත දැක්වෙන වරදවල් ඇතුළත් වේ:**

1. ඕනෑම පන්තියක ආගමකට අපහාස කිරීමේ චේතනාවෙන් ආගමික ස්ථානයකට හානි කිරීම හෝ අපවිත්‍ර කිරීම (290 වගන්තිය)
2. ඕනෑම පන්තියක ආගමකට අපහාස කිරීමේ චේතනාවෙන් සිද්ධස්ථාන සම්බන්ධයෙන් සිදු කරනු ලබන ක්‍රියා (290A වගන්තිය)
3. ආගමික රැස්වීමකට බාධා කිරීම (291 වගන්තිය)
4. ඕනෑම පූජනීය ස්ථානයකට හෝ ඕනෑම සොහොන් බිමකට අනවසරයෙන් ඇතුළුවීම (292 වගන්තිය)

විශේෂයෙන් ම, ICCPR පනතේ 3 වැනි වගන්තිය යටතේ වන වරදක් 'හඳුනා ගත හැකි සහ ඇප දිය නොහැකි' වන අතර, එවැනි වරදක් සම්බන්ධයෙන් සැක කරන හෝ චූදිත කිසිවකු සුවිශේෂී අවස්ථාවන්හිදී මහාධිකරණයෙන් හැර ඇප මත නිදහස් කළ නොහැක.

**දණ්ඩ නීති සංග්‍රහයේ හඳුනා ගත නොහැකි වැරදිවලට ඇතුළත් වන්නේ:**

1. ආගමික හැඟීම්වලට හානි කිරීම සඳහා හිතාමතාම චේතනාවෙන් වචන පැවසීම (291A වගන්තිය); හා

2. ඕනෑම පන්තියක ආගමට හෝ ආගමික විශ්වාසයන්ට අපහාස කිරීමෙන් ආගමික හැඟීම් කෝපයට පත් කිරීමට අදහස් කරන හිතාමතා සහ ද්වේෂ සහගත ක්‍රියා (291B වගන්තිය).

# නඩුවකට සූදානම්වීම සඳහා මාර්ගෝපදේශ

## 3. නඩුවකට සූදානම්වීම සඳහා මාර්ගෝපදේශ

නීතිවේදියකු FoRB නඩුවක තමන්ගේ සේවාදායකයා නියෝජනය කිරීමට සූදානම්වීමේදී, තිබේදැයි පරීක්ෂා කර බැලියයුතු, සහ ලබාගතයුතු තොරතුරු සහ සාක්ෂි වර්ග මෙම කොටසේ ඇතුළත් කර තිබේ.

අවශ්‍ය නීති සහය හැකිතාක් ඉක්මනින් සේවාදායකයා වෙත ලබාදීම සඳහා, පහත දැක්වෙන පියවර අනුගමනය කරන බවත් අවශ්‍ය සියළුම තොරතුරු එකතු කරගන්නා බවත් සහතික කරගැනීමට නීතිවේදියා විසින් කටයුතු කළයුතු වේ.

<u>1 අදියර</u>

1. **සේවාදායකයාගේ ජීව දත්ත**
   - 1.1 සේවාදායකයාගේ පසුබිම් තොරතුරු: මීට සේවාදායකයාගේ නම, ලිපිනය, උපන් දිනය, ප්‍රජාවට ඇති සම්බන්ධතාවය (වර්තමානයේ පදිංචි ලිපිනයේ පදිංචිව සිට ඇති කාලය, පවුල් සම්බන්ධතා, අධ්‍යාපන ඉතිහාසය, රැකියා ඉතිහාසය, අපරාධ ඉතිහාසය, නොපමාව ලැබියයුතු වෛද්‍යාධාර පිළිබඳ තොරතුරු, හදිසි අවස්ථාවක සම්බන්ධ කරගතයුතු තැනැත්තා පිළිබඳ විස්තර).

2. **සිදුවීම සම්බන්ධයෙන් තොරතුරු**
   - 2.1 සිදුවීම සම්බන්ධයෙන් පවතින මූලික තොරතුරු. (සිද්ධියට අදාළවන වෙනත් තොරතුරු ද ඇත්තේ නම් ඒවාද ඇතුළුව) පහත දැක්වෙන තොරතුරු එකතු කරගත යුතු වේ:
     - 2.1.1 චෝදනා කරන සිදුවීමට මගපෑදූ වාතාවරණය;
     - 2.1.2 සිදුවීම අවස්ථාවේ එම ස්ථානයේ සිටි පුද්ගලයින්ගේ විස්තර - චෝදනා කරන වරද/ වරදවල් සඳහා ඔවුන් සහභාගි වූයේද යනවග;
     - 2.1.3 එක් එක් පුද්ගලයාගේ භූමිකාව සහ, විශේෂයෙන් සිදුකළ වරදවල ස්වභාවය;
     - 2.1.4 සිදු වූ දෙය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි සාක්ෂිකරුවන්ගේ විස්තර;
     - 2.1.5 සාක්ෂිකරුවන් වියහැකි තැනැත්තන්ගේ ප්‍රකාශ
     - 2.1.6 සේවාදායකයා සමගින් සිදුකළ සම්මුඛසාකච්ඡාවේදී එකතුකරගත් අනෙකුත් සාක්ෂි; සහ
     - 2.1.7 සිදුවීම සම්බන්ධයෙන් මාධ්‍යවල පළවූ වාර්තා වැනි, ද්වීතියික මූලාශ්‍රවලින් සොයාගත් ස්වාධීන කරුණු

<u>2 අදියර</u>

3. **ලේඛන, පුද්ගලයින් සහ ස්ථානය පරීක්ෂා කිරීම**
   - 3.1 ඉහත දත්ත එකතු කරගත් පසු, සියළුම ලේඛණ, ප්‍රදර්ශිත, සහ ලබාගත හැකි වූ අනෙකුත් සියළුම ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම පරීක්ෂාවට සහ පිරික්සුමට ලක් කළ යුතු වේ.
   - 3.2 හැකිනම්, සිදුවීමට අදාළ කරුණු සම්බන්ධයෙන් ඔවුන්ගේ කථාව දැනගැනීම සඳහා ඇසින් දුටු සාක්ෂිකරුවන් සම්මුඛ සාකච්ඡාවට ලක් කළ යුතු වේ.
   - 3.3 හැකිනම්, මෙම සිද්ධියට අදාළ තොරතුරු ඇති, සාක්ෂිකරුවන් වියහැකි වෙනත් පුද්ගලයින් සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීම.
   - 3.4 හැකිනම්, චෝදනා කරන සිදුවීමට අදාළ ස්ථානය පරීක්ෂා කිරීම.

4. **කාල රේඛාව ස්ථාපිත කරගැනීම**
   - 4.1 කරුණු සහ සිදුවීම් සම්බන්ධයෙන් සේවාදායකයා පැවසූ දේවල් තහවුරු කරගැනීම සහ ඒවා තහවුරු කිරීම සඳහා පවතින සාක්ෂි මත පදනම් වෙමින් සිදුවීම වූ කාල රේඛාව සූදානම් කරගැනීම (එනම්, සිදුවීමට අදාළව සහ සිදුවීමට හේතුවෙමින් ඊට පෙර සිදු වූ දේවල් සඳහා සවිස්තරාත්මකව කාල රේඛාවක් සකස් කරගැනීම).

**3 අදියර**

**5. මූලික නීතිමය පියවර සඳහා මුලපිරීම**

5.1 සේවාදායකයාට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මුලපිරීම සඳහා අවශ්‍යදැයි විමසීම වැනි මූලික උපදෙස් සේවාදායකයාගෙන් ලබාගන්න; නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නම්, සේවාදායකයා ගැනීමට කැමති නීතිමය ක්‍රියාමාර්ගය කුමක්දැයි තහවුරු කරගන්න.

5.2 සේවාදායකයාගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීමට ගතයුතු මූලික නෛතික පියවර කිසිවක් ඇත්තේදැයි සිතා බලා එම පියවර ගැනීමට කටයුතු කිරීම.[11] මීට පහත දැක්වෙන පියවර ඇතුළත් වීමට ඉඩ තිබේ:

5.2.1 අවශ්‍ය කරන යම් තොරතුරක් ලබාගැනීම සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීම (RTI අයදුමක් සඳහා වන ආකෘතිය මෙහි 1 ඇමුණුමේ දක්වා තිබේ) [12]

5.2.2 වෛද්‍ය සාක්ෂි අවශ්‍ය නම්, සිදුව තිබෙන තුවාල හෝ ලබාදුන් ප්‍රතිකාර යනාදිය නියමාකාරයෙන් වෘත්තීමය ලෙස ලේඛනගත කෙරෙන බව සහතික කරගැනීම

5.2.3 ඔබේ සේවාදායකයා යම්කිසි නිශ්චිත ක්‍රියාමාර්ගයකට එළඹ ඇති බව වරද කළ පුද්ගලයා හෝ සංවිධානය වෙත දැනුම්දීම සඳහා එන්තරවාසි යැවීම හෝ,

5.2.4 අදාළ වේ නම්, පොලිස් පැමිණිලි හෝ මානව හිමිකම් කොමිෂන් සභාවට යවන පැමිණිලි නියමාකාරයෙන් ඉදිරිපත් කර තිබේදැයි සහතික කරගැනීම

5.2.5 (අවශ්‍ය වේ නම්) ග්‍රාම නිලධාරි සහතික ලබාගැනීම.

**6. අදාළවන උපකාරක නීති කවරේදැයි තක්සේරු කිරීම**

අදාළ තොරතුරු සමීක්ෂණය කිරීමේදී, නාගරික සංවර්ධන අධිකාරී නීතිය, නගරසභා නීතිය සහ, 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනත හා 1979 අංක 23 දරන මහවැලි අධිකාරී පනතවනි ඉඩම් නීති යටතේ නිකුත් වී ඇති, අදාළ වන උපකාරක නීති කවරේදැයි තක්සේරු කෙරෙන බව සහතික කරගන්න.

**7. වින්දිතයාට ඇති වූ බලපෑම පිළිබඳ ප්‍රකාශ සටහන් කරගැනීම** (අදාළ අපරාධය හේතුවෙන් වින්දිතයාට ඇතිවූ බලපෑම සම්බන්ධයෙන්)

2015 අංක 4 දරන අපරාධවල වින්දිතයින් සඳහ සහය සහ ආරක්ෂාව ලබාදීමේ පනතේ (VWP පනත) 28 වැනි වගන්තිය යටතේ ලබාදෙන වන්දිය තීරණය කිරීම සඳහා මහාධිකරණයෙන් හෝ මහේස්ත්‍රාත් අධිකරණයෙන් එවැනි ප්‍රකාශයක් කැඳවුම් කිරීමට ඉඩ තිබේ..

VWP පනත යටතේ පහත දැක්වෙන අවස්ථාවලදී ආරක්ෂණ ක්‍රියාමාර්ග ලබාගත හැකිය:

- අපරාධ විමර්ශනය සිදුවන අතරතුර හා ඉන් පසුව;
- කොමිෂන් සභාවෙන් විමර්ශනය කිරීමට පෙර, කෙරෙන අතරතුර සහ ඉන් පසුව;
- අධිකරණ කාර්යපටිපාටි ආරම්භ කිරීමට පෙර, ඒ අතරතුර සහ ඉන් පසුව.

පනතේ 22 වැනි වගන්තියේ තාවකාලික නවාතැන් පහසුකම්, ස්ථිරව වෙනත් තැනක පදිංචිය සහ නැවත-අනන්‍යතාකරණය ඇතුළු විවිධ ආධාර සහ ආරක්ෂාවන් සම්බන්ධයෙන් සඳහන් කර තිබේ. මෙම නීතිය පිළිබඳ මනා දැනුවත්භාවයක් තිබීම මේ අංශයට අදාළ නඩු කටයුතු මෙහෙයවන නීතිවේදියකුට ප්‍රයෝජනවත් වනු ඇත.

[11] International Bridges to Justice, *Sri Lanka Criminal Defence Practice Manual*, at https://www.ibj.org/wp_main/wp-content/uploads/2020/04/English-4.pdf; DIGNITY and the Public Committee Against torture in Israel (PCATI), *Documenting Torture While Providing Legal Aid: A Handbook for Lawyers*, at https://www.dignity.dk/wp-content/uploads/Documenting-torture-while-providing-legail-aid-A-handbook-for-lawyers-2016.pdf.

[12] For more information on RTI templates and process see 'RTI Sri Lanka' at https://www.rti.gov.lk/rti-forms.

සටහන: VWP පනත යටතේ ලබාගතහැකි ආරක්ෂාවේ ස්වභාවය සම්බන්ධයෙන් තොරතුරුවල හිඟයක් පවතින බවක් පෙන්නෙනට තිබේ. වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියේ 2019 වාර්ෂික වාර්තාවට අනුව, එම අධිකාරියට ලැබුණු පැමිණිලි 252 අතරින් ආරක්ෂාව ලබාදුන් පැමිණිලි සංඛ්‍යාව දහ හතරකි.[13] එබැවින්, තමන් නියෝජනය කරන පුද්ගලයා වෙනුවෙන් ලැබෙන ආරක්ෂාව කුමන ස්වරූපයේ ආරක්ෂාවක්ද සහ එය කොතරම් ඵලදායී වේ ද යන්න පිළිබඳව තහවුරු කරගැනීමට ගතහැකි සියළුම පියවර ගැනීමට නීතිවේදියකු කටයුතු කළයුතු වේ.

[13] Annual Report-2019, National Authority for the Protection of Victims and Witnesses, at https://napvcw.gov.lk/img/gallery/publications/Annual_Report_2019_English.pdf.

# FORB නඩුකර හැසිරවීම

# 4. FoRB නඩුකර හැසිරවීම

FoRB සම්බන්ධයෙන් වන යම් යම් නඩු හසුරුවන්නේ කෙසේද යන්න පිළිබඳව මෙම කොටස හරහා නීතිවේදීන් වෙත මගපෙන්වනු ලැබේ. එම මගපෙන්වීම මූලික පියවර තුනක් යටතේ සිදු කෙරේ:

- 1 පියවර: උල්ලංඝනයක් සිදුවී ඇතිදැයි තීරණය කරන ආකාරය
- 2 පියවර: මණ්ඩපය තෝරාගන්නා ආකාරය
- 3 පියවර: නඩුව ගොනු කිරීම

මේ කොටසේ දී මුලින්ම කරන්නේ ඉහත පියවරවලට අදාළව පොදුවේ පසුබිම පැහැදිලි කර දීමයි. ඉන් අනතුරුව එම පියවර FORB නඩුපැවරීමේදී බහුලව හමුවන තේමාත්මක අංශ කිහිපයකට අදාළ කරගන්නා ආකාරය පැහැදිලි කරනු ලැබේ. එම තේමාත්මක අංශ අතරට පහත දැක්වෙන ඒවා ඇතුළත් වේ:


1. ආගමික ආයතන ඉදිකිරීම හා නඩත්තුව නියාමනය කිරීම
2. ආගම ප්‍රගුණ කිරීම සීමා කිරීම
3. ආගමික අනන්‍යතාවය පදනම් කරගෙන වෙනස්කොට සැලකීම
4. ආගමික අනන්‍යතාවය සම්බන්ධවන ප්‍රචණ්ඩත්වය
5. කථනය සම්බන්ධ වරද

මේ තේමාත්මක අංශ සම්බන්ධයෙන් කටයුතු කළයුත්තේ කුමන ආකාරයෙන්ද යන්න සම්බන්ධයෙන් නීතිවේදීන්ට මග පෙන්වීම සඳහා රූප සටහන් ඇසුරෙන් උපදෙස් ලබා දී තිබේ.

**a. අ. පොදු පියවර**

***1 පියවර: උල්ලංඝනයක් සිදුවී ඇතිදැයි තීරණය කරන ආකාරය***

යම් සිදුවීමක් FORB විෂයපථය යටතට ඇතුළුවන්නේදැයි තීරණය කිරීම සම්බන්ධයෙන් පහත 1 රූපයේ මගපෙන්වා තිබේ. වියහැකි සියළුම සිදුවීම් මෙහි ඇතුළත් කර නොමැතිබව සලකන්න.


If yes, then it may be one of the following issues:
සිදුවීමට පහත ඒවායින් එකක් ඇතුළත් වේද?
පූජාවිධිමය හෝ චාරිත්‍රමය ක්‍රියාවක්
ආගමික ස්ථාන ඉදිකිරීම
පූජාවිධිමය සූත්‍ර සහ ද්‍රව්‍ය භාවිතා කිරීමක්, හෝ සංකේත ප්‍රදර්ශනය කිරීම
නිවාඩු දින හෝ විවේක දින පිළිපැදීම
විශේෂිත ඇඳුම් හෝ හිස ආවරණ පැළඳීම
ජීවිතයේ යම් යම් අවධීන් හා බැඳුනු චාරිත්‍රවලට සහභාගිවී
අනුභව කරන ආහාර නියාමනය වැනි සිරිත් පිළිපැදීම
පූජක විද්‍යාල හෝ ආගමික පාසල් ඇතිකිරීමට තිබෙන නිදහස
ආගමික ග්‍රන්ථ හෝ ප්‍රකාශන සූදානම් කිරීමට සහ බෙදාහැරීමට ඇති නිදහස
යම් යම් ආර්ථික ක්‍රියාකාරකම් (ආගමික අනන්‍යතාවය හේතුවෙන්) තහනම් කිරීම
(ආගමික අනන්‍යතාවය හේතුවෙන්) ප්‍රසිද්ධ රැස්වීම් තහනම් කිරීම
නීතිය අදාළ කරගැනීමේ දී (ආගමික අනන්‍යතාවය හේතුවෙන්) වෙනස්කොට සැලකීම
(ආගමික අනන්‍යතාවය මත පදනම් වෙමින්) ඝාතන සිදුකිරීම, දේපළ විනාශ කිරීම
(ආගමික අනන්‍යතාවය මත පදනම් වෙමින්) තර්ජන, බියගැන්වීම් හෝ බලහත්කාර ක්‍රියා සිදු කිරීම
වන්දනාමානවල අංග වේ
පිළිපැදීම සහ ප්‍රගුණ කිරීමේ අංග වේ
ප්‍රගුණ කිරීමේ සහ ඉගැන්වීමේ අංග වේ
සමාජ ආර්ථික වෙනස්කොට සැලකීම
දේශපාලනික වෙනස්කොට සැලකීම
නීතිය වෙනස්කොට සලකනසුළු අන්දමින් අදාළ කරගැනීම
ශාරීරික ප්‍රචණ්ඩත්වය
ශාරීරික-නොවන ප්‍රචණ්ඩත්වය
FoRB උල්ලංඝන
ආගමික වෙනස්කොට සැලකීම
ආගමික ප්‍රචණ්ඩත්වය

*වර: මණ්ඩපය තෝරාගන්නා ආකාරය*

සිදුවූ උල්ලංඝනය FORB විෂයපථයට ඇතුළත් වන බව හඳුනාගැනීමෙන් අනතුරුව, එම කරුණ පිළිබඳව සලකා බැලීමට වඩාත්ම සුදුසු මණ්ඩපය කුමක්දැයි තෝරාගැනීමට නීතිවේදියකුට හැකිය. එසේ කිරීමේදී, සේවාදායකයාට අවශ්‍ය කරන සහනය කුමක්ද යන්න මත, සේවාදායකයාට වඩාත්ම සුදුසුවන ක්‍රියාමාර්ගය කුමක්ද යන්න සිතේ තබාගනිමින්, යුක්තිය ලබදීමට අධිකරණ බලය සහිත මණ්ඩපයක් ඒ සඳහා තෝරාගැනීමට නීතිවේදියා විසින් කටයුතු කළයුතු වේ.

සුදුසු මණ්ඩපයක් තෝරාගැනීමේදී නිසි අවබෝධයකින් එම තීරණයට එළඹීම සඳහා පහත දැක්වෙන මූලික පියවර ප්‍රයෝජනවත් වනු ඇත.

| | | |
|---|---|---|
| **I.**<br>උල්ලංඝනයේ ස්වභාවය කුමක්ද? | නීතියක්, නියාමනයක් හෝ මාර්ගෝපදේශයක් | ඔව්/නැත |
| | වාචික හෝ ලිඛිත සන්නිවේදනයක් | ඔව්/නැත |
| | අත්අඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම | ඔව්/නැත |
| | ශාරීරික හිංසන ක්‍රියාවක් | ඔව්/නැත |
| | ශාරීරික නොවන ප්‍රචණ්ඩ ක්‍රියාවක් (තර්ජනය හෝ හිරිහැර කිරීම) | ඔව්/නැත |

උල්ලංඝනයේ ස්වභාවය හඳුනාගත් පසු, ඊට ගැලපෙන මණ්ඩපය තෝරාගැනීම සඳහා, අදාළ ක්‍රියාවට වගකිවයුතු පාර්ශවයක් කවුදැයි හඳුනාගත යුතු වේ.

| | | |
|---|---|---|
| **II.**<br>උල්ලංඝනයට වගකිවයුතු හෝ ඊට සහයදුන් පාර්ශව මොනවාද? | රාජ්‍ය නිලධාරියකු/ නිලධාරීන් | ඔව්/නැත |
| | රාජ්‍ය නිලධාරියකු/ නිලධාරීන්ගේ සහය ඇතිව රාජ්‍ය නොවන ක්‍රියාකරුවකු/ ක්‍රියාකාරීන් | ඔව්/නැත |
| | රාජ්‍ය දිරිගැන්වීම හෝ රජයෙන් ඔවුන්ගේ ක්‍රියා ඉවසා සිටීම මත ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන ක්‍රියාකරුවකු/ ක්‍රියාකාරීන් (තනි පුද්ගලයකු හෝ කණ්ඩායමක්) | ඔව්/නැත |

ඉහත ප්‍රශ්නවලට ලැබෙන ප්‍රතිචාර අනුව, පහත ඉදිරිපත් කර ඇති වරණ අතරින් සුදුසු මණ්ඩපයක් තෝරාගැනීමට නීතිවේදියාට හැකි ය.

| වරණය | මණ්ඩපය | ප්‍රධාන තොරතුරු |
|---|---|---|
| **1.** | **ශ්‍රේෂ්ඨාධිකරණය**<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 118 සහ 126 වැනි ව්‍යවස්ථා | • ජනරජයේ ඉහළම සහ අවසාන උපරිමාධිකරණය වේ.<br>• <u>විධායක හෝ පරිපාලන ක්‍රියාවක්</u> හරහා ඕනෑම මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකමක් උල්ලංඝනයවීම හෝ උල්ලංඝනයකට අත්‍යාසන්න වීම සම්බන්ධයෙන් වන ප්‍රශ්න විභාග කර තීන්දු ලබාදීම සඳහා පූර්ණ සහ විශේෂ අධිකරණ බලය හිමි වේ.<br>• ඕනෑම පෙත්සමක සඳහන්වන කරුණු සම්බන්ධයෙන් සාධාරණ හා යුක්තිසහගත වන්නේ යැයි එම අධිකරණයෙන් සලකනු ලබන <u>සහන ලබාදීමට හෝ නියෝග නිකුත් කිරීමට</u> ශ්‍රේෂ්ඨාධිකරණයට බලය හිමි ය.<br>• අභියාචනාධිකරණය හෝ වෙනත් ඕනෑම මුල් අවස්ථා අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ වෙනත් ආයතනයක් විසින් කරුණු සම්බන්ධයෙන් හෝ නීතිය සම්බන්ධයෙන් සිදුකළ සියළු දෝෂ නිවැරදි කිරීමට ශ්‍රී ලංකා ජනරජය තුළ අවසාන සිවිල් සහ අපරාධ අභියාචනා අධිකරණ බලය සහිත අධිකරණයයි. |

| | | |
|---|---|---|
| | | සියළුම නඩු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබාදෙන තීන්දු සහ නියෝග අවසාන සහ තීරණාත්මක වනු ඇත.<br>• විධායක හෝ පරිපාලන ක්‍රියාවකින් තමන්ගේ මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකමක් උල්ලංඝනය වී ඇති බවට හෝ උල්ලංඝනය වීමට ආසන්න බවට යම් පුද්ගලයෙක් විසින් චෝදනා කරන්නේ නම්, <u>මාසයක කාලයක් තුළ ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් අයදුමක් ගොනු කළ යුතු වේ</u>. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ මෙම මාසයක කාලයක් සම්බන්ධයෙන් දැක්වෙන රීතියට ව්‍යතිරේකයක් ඇතුළත් කර තිබේ.<br><br>• අයිතිවාසිකම් උල්ලංඝනයට ලක් වූ තැනැත්තා තමන් විසින්ම හෝ තමන්ගේ නීතිඥයා මාර්ගයෙන් අධිකරණයට පෙත්සම් ඉදිරිපත් කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මූලික වශයෙන් නියම කර තිබේ. පෙත්සම්කරු තවත් අය සමගින් එකම කරුණක් සම්බන්ධයෙන් ලැදියාව සහිත අවස්ථා හෝ, පොදුවේ මහජනතාවට අදාළ වන ලැදියාවන් සම්බන්ධයෙන් ද මෙහිදී පිළිගැනීමට ලක් කර ඇත.[14] |
| **2.** | **අභියාචනාධිකරණය**<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138, 139, 140 සහ 141 වැනි ව්‍යවස්ථා | • කරුණු හෝ නීතිය සම්බන්ධයෙන් සිදු වී ඇති සියළුම දෝෂ නිවැරදි කිරීමට අදාළව අභියාචන අධිකරණ බලය තිබේ.<br>• නීතියට අනුව යම් නියෝගයක්, තීන්දුවක්, නියමයක්, හෝ දණ්ඩන නියමයක් තහවුරු කිරීමට, ආපසු හැරවීමට, නිවැරදි කිරීමට, හෝ වෙනස් කිරීමට අභියාචනාධිකරණට හැකි අතර, අභියාචනාධිකරණයට සුදුසු යැයි සලකන කොන්දේසි යටතේ අළුතින් නඩු විභාගයක් පැවැත්වීමට හෝ තවදුරටත් විභාග කිරීමට හෝ නියම කිරීමට හැකියාව තිබේ.<br>• ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක වාර්තා සෝදිසි කර සහ පරීක්ෂා කර බලා, ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක විනිසුරු වෙත සර්ෂියොරාරි,[15] ප්‍රොහිබිෂන්,[16] ප්‍රොසිඩෙන්ඩෝ,[17] මැන්ඩාමුස්[18] සහ ක්වෝ වොරොන්ටෝ[19] යන ස්වභාවයේ රිට් ආඥා නීතිය ප්‍රකාරව ප්‍රදානය කිරීමට පූර්ණ බලතල සහ අධිකාරය තිබේ.<br>• හේබියස් කෝපුස් වර්ගයේ රිට් ආඥා ප්‍රදානය කිරීමට සහ නිකුත් කිරීමට අභියාචනාධිකරණයට හැකිය.[20] |
| **3.** | **මහාධිකරණය**<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154P ව්‍යවස්ථාව; 1978 අංක | • පළාත තුළ සිදු වූ අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහාධිකරණයට මුල් අධිකරණ බලය හිමි වේ. |

---

[14] බුලන්කුලම සහ වෙනත් අය එදිරිව ලේකම්, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සහ වෙනත් අය නඩුව බලන්න (එප්පාවෙල නඩුව) *[2000] 3 SLR 243.*

[15] සර්ෂියොරාරි ආඥාව යනු වලංගු නොවන හෝ නීති විරෝධී සහ ultra vires අවලංගු කිරීමට හෝ පසෙකට දැමීම සඳහා වන ආඥාවකි. වැඩි විස්තර සඳහා හර්ජානි එදිරිව ඉන්දියන් ඕවර්සීස් බැංකුව නඩුව බලන්න. *Harjani v Indian Overseas Bank [2005] 1 SLR 167 .*

[16] ප්‍රොහිබිෂන් රිට් ආඥාව යනු අධිකරණ බලය ඉක්මවා යන ක්‍රියාවන් තහනම් කිරීමේ ආඥාවකි.

[17]ප්‍රොසෙඩෙන්ඩෝ රිට් ආඥාව යනු වලංගු බලය ක්‍රියාත්මක කිරීමට නියෝග කිරීමේ ආඥාවකි..

[18] මැන්ඩාමුස් රිට් මැන්ඩමස් ආඥාව යනු රාජකාරියක් ඉටු කිරීමට පොදු අධිකාරියකට බලකිරීමේ ආඥාවකි. වැඩිදුර විස්තර සඳහා පහත නඩු බලන්න: *Karunathilaka v Dayananda Dissanayake, Commissioner of Elections [1999] 1 SLR 157, Podimhatmaya v. The Land Reform Commission [1990] 2 SLR 416 at 419, Rashid v. Rajith Senaratne, Ministry of Lands and others [2004] 1 SLR 312.*

[19] ක්වෝ වොරොන්ටෝ රිට් ආඥාවක් යනු රාජ්‍ය නිලතල දරන පුද්ගලයෙකුගේ අධිකාරියට අභියෝග කිරීම සඳහා වන ආඥාවකි. වැඩි විස්තර සඳහා Dilan Perera v Rajitha Senaratne [2000] 2 SLR 79 බලන්න.

[20] හේබියස් කෝපුස් රිට් ආඥාව යනු පුද්ගලයෙකුගේ භාරකාරත්වයේ හෝ රඳවා තබා ගැනීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ තීරණයක් සඳහා ඔහුගේ සිරුරක් ඉදිරිපත් කිරීම සඳහා වන ආඥාවකි.

| | | |
|---|---|---|
| | 2 දරන අධිකරණ පනත (සංශෝධිත) | • පළාත තුළ ඇති මහේස්ත්‍රාත් අධිකරණ සහ ප්‍රාථමික අධිකරණ විසින් ලබාදුන් හෝ පැනවූ දණ්ඩන, නියම කිරීම්, තීන්දු සම්බන්ධයෙන් අභියාචන සහ සමාලෝචන බලතල හිමි ය.<br>• නීතිය අනුව, අ) පළාත තුළ නීති විරෝධී ලෙස රඳවා තැබූ පුද්ගලයින් සම්බන්ධයෙන් හේබියස් කෝපුස් වර්ගයේ රිට් ආඥා; සහ ආ) 1) ඕනෑම නීතියක්; හෝ 2.) පළාත්සභා ලැයිස්තුවේ දක්වා ඇති ඕනෑම කරුණක් සම්බන්ධයෙන් එම පළාතේ පිහිටවා ඇති පළාත් සභාවෙන් සම්මත කරගත් ප්‍රඥප්තියක් යටතේ පළාත තුළ බලතල ක්‍රියාත්මක කරන්නා වූ ඕනෑම පුද්ගලයකුට එරෙහිව සර්ෂියොරාරි, ප්‍රොහිබිෂන්, ප්‍රොසිඩෙන්ඩෝ, මැන්ඩාමුස් සහ ක්වෝ වොරොන්ටෝ යන වර්ගයක රිට් ආඥා නිකුත් කිරීමේ අධිකරණ බලය හිමිය.<br>• පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ඕනෑම පුද්ගලයකුට එරෙහිව ලිඛිත නීතියෙන් සලසා ඇති විධිවිධාන අනුව නඩු පැවරීම හෝ අධි චෝදනා ගොනුකිරීම සම්බන්ධයෙන් විභාග කිරීමට, නඩු විභාග පැවැත්වීමට සහ තීන්දු දීමට බලය සහ අධිකාරය සාමාන්‍යයෙන් මහාධිකරණයට පැවරේ:<br>අ) මුළුමනින්ම හෝ කොටසක් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද ඕනෑම වරදක්;<br>ආ) ශ්‍රී ලංකාවට අයත් ජලතීරය මත ඕනෑම පුද්ගලයකු විසින් සිදු කරන ලද වරදක්;<br>ඇ) ශ්‍රී ලංකාවට අයත් ගුවන් තීරය මත ඕනෑම පුද්ගලයකු විසින් සිදු කරන ලද වරදක්;<br>ඈ) මහමුහුදේ දී ඕනෑම තැනැත්තකු විසින් සිදුකරන ජාතීන්ගේ නීතිය අනුව මුහුදු මංකොල්ලකෑම වශයෙන් සලකන ඕනෑම වරදක්;<br>ඉ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති, ඕනෑම කාණ්ඩයකට අයත් ඕනෑම නෞකාවක් හෝ ගුවන් යානයක් මත හෝ ඒ සම්බන්ධයෙන් ඕනෑම පුද්ගලයකු විසින් සිදුකරනු ලබන වරදක්;<br>ඊ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන ඕනෑම පුද්ගලයෙකු විසින් ශ්‍රී ලංකා භූමියෙන් පිටත ඕනෑම ස්ථානයක හෝ නෞකාවකදී හෝ කුමන වර්ගයට අයත් ඕනෑම නෞකාවක් හෝ ගුවන් යානයක් සම්බන්ධයෙන් සිදු කරන ලද ඕනෑම වරදක්. |
| **4.** | **මහේස්ත්‍රාත් අධිකරණය**<br><br>1978 අංක 2 අධිකරණ පනතේ 30 වැනි වගන්තිය (සංශෝධිත) | • දණ්ඩ නීති සංග්‍රහයේ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ හෝ ඒ වෙනුවෙන් ඔවුන් බලගන්වන හෝ එසේ කිරීමට නියම කරන වෙනත් ඕනෑම පනතක විධිවිධාන ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණයට බලය පවරන ලද, ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අවශ්‍ය සියලු බලතල සහ බලතල සෑම මහේස්ත්‍රාත් අධිකරණයකටම තිබිය යුතු අතර ඒවා ක්‍රියාත්මක කළ යුතුය. , ඒ වෙනුවෙන් ඔවුන් බලගැන්වීම හෝ අවශ්‍ය කිරීම දැනට බලාත්මක වේ. |
| **5.** | **මහේස්ත්‍රාත් අධිකරණය**<br><br>පුද්ගලික පැමිණිලි<br><br>1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ පනතේ 136(1)(අ) වගන්තිය (සංශෝධිත) | • පරීක්ෂණ පැවැත්වීම හෝ නඩු විභාග කිරීමට හෝ එම අධිකරණයට අධිකරණ බලය ඇති වරදක් සිදු කර ඇති බවට වාචික හෝ ලිඛිත පැමිණිල්ලක් එම අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා වෙත වෙන් කරනු ලැබූ විට සහ එවැනි පැමිණිල්ලක් ලිඛිතව කරනු ලැබේ නම් එය උත්තරවාදියකු විසින් පිළියෙල කරනු ලැබ අනු අත්සන් කර චෝදනාකරු විසින් එය අත්සන් කර ඇත්තේ නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය.<br><br>• රාජ්‍ය නිලධාරියෙකුට හෝ සේවකයෙකුට එරෙහිව එවැනි නිලධාරියෙකුගේ හෝ සේවකයෙකුගේ නිල රාජකාරි ඉටුකිරීමට සම්බන්ධ හෝ අදාළ කරුණක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ගොනු කර ඇත්තේ නම් මිස, මෙම විධිවිධානය යටතේ පැමිණිල්ලක් ගොනු කළ පසු, නීතිපතිවරයාට, සොලිසිටර් ජනරාල්වරයාට, රජයේ නීතිඥවරයෙකුට හෝ අභියාචනාකරුවෙකුට |

| | | |
|---|---|---|
| | | සාමාන්‍යයෙන් හෝ නීතිපතිවරයා විසින් විශේෂයෙන් බලය පවරන ලද නීතිවේදියකුට පැමිණිලිකරු වෙනුවෙන් ඔහුගේ අවසරයකින් තොරව පෙනී සිටීමට අයිතියක් නැත. |
| **6.** | **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**<br><br>1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 සහ 14 වගන්ති | • කොමිෂන් සභාව තමන් විසින්ම හෝ, අගතියට පත් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් හෝ, අගතියට පත් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් යම් පුද්ගලයකු විසින් තමන් වෙත කරන ලද පැමිණිල්ලක් මත එම පුද්ගලයාගේ හෝ පුද්ගල කණ්ඩායමේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම හෝ උල්ලංඝනයට ආසන්නවීම සම්බන්ධයෙන් වන චෝදනා විමර්ශනය කිරීමට හැකි ය.<br>• 14 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදුකරන විට, විධායක හෝ පරිපාලන ක්‍රියාවකින් හෝ යම් පුද්ගලයකු අතින්, මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වී ඇති බව හෝ උල්ලංඝනයට ආසන්න බව හෙළිදරව් වුවහොත්, සමාදාන කිරීම හෝ සමථකරණය යන විකල්ප සලකා බැලීමෙන් පසුව කොමිෂන් සභාව පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කිරීමට ඉඩ තිබේ:<br>    • එම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය සිදුකළ තැනැත්තා හෝ තැනැත්තන්ට එරෙහිව නඩු පැවරීම හෝ වෙනත් නෛතික ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ කිරීම;<br>    • ඕනෑම පුද්ගලයකු විසින් අදාළ අධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටීම සඳහා ලබාදී ඇති කාලසීමාව තුළ, නියම වී ඇති නීතිරීති ප්‍රකාරව අදාළ කරුණු සම්බන්ධයෙන් කරුණු විභාග කර තීන්දුවක් ලබාදීම සඳහා ඊට අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත එම කරුණු යොමු කිරීම;<br>    • අදාළ උල්ලංඝනය වැලැක්වීමේ, හෝ ඊට ප්‍රතිකර්ම ලබාදීමේ අරමුණින්, නැතහොත් උල්ලංඝනය අඛණ්ඩව සිදුවීම වැලැක්වීමේ අරමුණින් අදාළ බලධාරියා, පුද්ගලයා හෝ පුද්ගලයින් වෙත තමන්ට සුදුසු යැයි හැඟෙන නිර්දේශ ලබාදීම. |

### *3 පියවර: නඩුව ගොනු කිරීම*

නීතිවේදියා විසින්, ඉහත ඉදිරිපත් කළ සියළුම තොරතුරු ඇගැයුම් කිරීමෙන් පසුව, අදාළ නඩුවට වඩාත්ම ගැලපෙන මණ්ඩපය කුමක්දැයි තීරණය කිරීම සඳහා පහත දැක්වෙන අභ්‍යාසයේ නිරතවීමට හැකි ය. ලබාගත හැකි සහන වර්ගය සහ අදාළවන මණ්ඩපය කුමක්ද යන්න සම්බන්ධයෙන් මේ දක්වා ඉදිරිපත් වූ කරුණු පහත වගුවෙන් ඒකරාශී කොට දක්වා තිබේ. පවතින සියළුම විකල්ප මෙම වගුවෙන් ආවරණය නොවේ. වඩාත්ම සුලභව දක්නට ඇති විකල්ප සහ ඒවාට අදාළවන ක්‍රියාකරුවන් සහ මණ්ඩපය කුමක්ද යන්න පිළිබඳව මෙහි සැකෙවින් පෙන්නුම් කර තිබේ.

| අංකය | ක්‍රියාකරු | චෝදනා එල්ල කළ හැසිරීම | සහනය | මණ්ඩපය |
|---|---|---|---|---|
| **1.** | රජයේ නිලධාරීන් | නීතිය අනුව ගතයුතු ක්‍රියාමාර්ග නොගැනීම | මැන්ඩාමුස් රිට් ආඥා | අභියාචනා අධිකරණය |
| **2.** | රජයේ නිලධාරීන් | නීතිය අවසර නොමැති ක්‍රියාමාර්ග නොගැනීම | සර්ෂියොරාරි/ ප්‍රොහිබිෂන් රිට් ආඥා | අභියාචනා අධිකරණය |
| **3.** | රජයේ නිලධාරීන් | නීතියෙන් නියම කර නොමැති, සාධාරණ නොවන කොන්දේසි පැනවීම | සර්ෂියොරාරි/ ප්‍රොහිබිෂන් රිට් ආඥා | අභියාචනා අධිකරණය |

| | | | | |
|---|---|---|---|---|
| **3.** | රජයේ නිලධාරීන් | ඔබේ සේවාදායකයා කළ පැමිණිල්ල සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වීම | මැන්ඩාමුස් රිට් ආඥා / FR / HRCSL පැමිණිලි | අභියාචනා අධිකරණය/ ශ්‍රේෂ්ඨාධිකරණය/ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම (HRCSL) |
| **4.** | රජයේ නිලධාරීන් | ඔබේ සේවාදායකයා විසින් තම අදහස් ප්‍රකාශ කිරීමට, තොරතුරු බෙදාහදාගැනීමට යනාදී අයිතිවාසිකම් භුක්තිවිඳීමෙන් ඔවුන් වැලැක්වීම | FR / HRCSL පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය/ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම (HRCSL) |
| **5.** | රජයේ නිලධාරීන් | අන් අය සමගින් රැස්වීම සහ එක්ව ආගමික ක්‍රියාකාරකම් සඳහා සහයෝගය දැක්වීමෙන් ඔබේ සේවාදායකයා වැලැක්වීම | FR / HRCSL පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය/ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම (HRCSL) |
| **6.** | රජයේ නිලධාරීන් | ඔබේ සේවාදායකයා ආගමික චාරිත්‍රයක් හෝ ප්‍රගුණ කිරීමක නිරතවීමෙන් වැලැක්වීම | FR / HRCSL පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය/ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම (HRCSL) |
| **7.** | රජයේ නිලධාරීන් | ඔබේ සේවාදායකයාගේ ආගමික අනන්‍යතාවය වෙනස් බැවින් තවත් පුද්ගල කණ්ඩායමකට වඩා වෙනස් ලෙස ඔබේ සේවාදායකයාට සැලකීම | FR / HRCSL පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය/ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම (HRCSL) |
| **8.** | රජයේ නිලධාරීන්ගේ සහයෝගය හෝ උදවු ඇතිව ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් | ඝාතන, පහරදීම්, දේපළ හානි, තර්ජන, බියවැද්දීම්, ප්‍රචණ්ඩත්වය සඳහා කුපිත කරවීම | දණ්ඩනීති සංග්‍රහයේ 290-294, 340-349, 408-421, 483-487 වගන්ති යටතේ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 හෝ 98 වගන්ති යටතේ හෝ ICCPR පනතේ 3 වගන්තිය යටතේ ගොනු කරන ලද අපරාධ නඩු | මහාධිකරණය |
| | | ඔබේ සේවාදායකයාගේ ක්‍රියාකාරකම් මහජන කරදරයක් වන බව චෝදනා කිරීම (ඔබේ සේවාදායකයා එම නඩුවේ වින්තිකරුවකු වීමට ඉඩ තිබේ) | | මහේස්ත්‍රාත් අධිකරණය |
| **9.** | රජයේ දිරිගැන්වීම හෝ ඉවසා සිටීම සමගින් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් (පුද්ගලයින් හෝ කණ්ඩායම්) | ඝාතන, පහරදීම්, දේපළ හානි, තර්ජන, බියවැද්දීම්, ප්‍රචණ්ඩත්වය සඳහා කුපිත කරවීම | දණ්ඩනීති සංග්‍රහයේ 290-294, 340-349, 408-421, 483-487 වගන්ති යටතේ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 හෝ 98 වගන්ති යටතේ හෝ ICCPR පනතේ 3 වගන්තිය යටතේ | මහාධිකරණය |
| | | ඔබේ සේවාදායකයාගේ ක්‍රියාකාරකම් මහජන කරදරයක් වන බව චෝදනා කිරීම (ඔබේ සේවාදායකයා එම නඩුවේ වින්තිකරුවකු වීමට ඉඩ තිබේ) | | මහේස්ත්‍රාත් අධිකරණය |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගොනු කරන ලද අපරාධ නඩු | |

පැමිණිල්ල සම්බන්ධයෙන් පොලීසිය ක්‍රියාත්මක නොවන අවස්ථාවලදී අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136(1) වගන්තිය යටතේ (ඉහත සාකච්ඡා කර ඇති පරිදි) පෞද්ගලික පැමිණිල්ලක් ගොනුකිරීම සම්බන්ධයෙන් ද නීතිවේදියාට සලකාබැලිය හැකිය. කෙසේනමුත්, සාක්ෂිමය වටිනාකමකින් යුත් වැදගත් වාර්තා යනාදිය කරා ප්‍රවේශවීමේදී මුහුණ දෙන්නට විය හැකි අභියෝග පිළිබඳව ද මෙහි දී නීතිවේදියා විසින් සලකා බැලිය යුතු වේ. (ව්‍යවහාරික විශ්ලේෂණ අවශ්‍ය වෙ නම් ගත යුතු අධිකරණ වෛද්‍ය නිලධාරි වාර්තා හෝ රජයේ රස පරීක්ෂක වාර්තා වැනි) ඇතැම් සම්පත් කරා රාජ්‍ය යන්ත්‍රණයට ඇති ප්‍රවේශය පෞද්ගලික පාර්ශවයකට නොතිබෙන්නට ඉඩ ඇත.

**ආ. නඩු පැවරීමේ තේමා ක්ෂේත්‍ර**

ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය (FoRB) සම්බන්ධ නඩුකරවලට පොදු තේමා කිහිපයක් තිබේ. පහත උපවගන්ති මගින් මෙම එක් එක් තේමා ක්ෂේත්‍රය සමීපව විමසා බලන අතර, නිදර්ශන භාවිතයෙන් එක් එක් ක්ෂේත්‍රයන්හි නඩු පැවරීම් පිළිබඳ මග පෙන්වීමක් ලබා දේ.

***(1) ආගමික ආයතනයක් ඉදිකිරීම හෝ නඩත්තු කිරීම නියාමනය කිරීම***

සාමාන්‍යයෙන්, මෙම උල්ලංඝනයන් සඳහා පූජනීය ස්ථානයක් හෝ වෙනත් ආගමික ආයතනයක් සඳහා ගොඩනැගිලි බලපත්‍ර අත්හිටුවීම හෝ ප්‍රතික්ෂේප කිරීම, පූජනීය ස්ථානයක් බලහත්කාරයෙන් 'ලියාපදිංචි කිරීම', ආගමික ආයතනයක දැනට කරගෙන යන ඉදිකිරීම් හෝ නඩත්තු කටයුත්තකට එරෙහිව ගොනු කරනු ලබන මහජන පීඩා නඩු හේතු විය හැක.

**සිද්ධි අධ්‍යයනය - අ**

ආගමික කණ්ඩායමක ප්‍රධානියෙකු වන X, ආගම ඉගැන්වීම් කටයුතු සඳහා දෙමහල් මධ්‍යස්ථානයක් පිහිටුවීමේ සංවර්ධන සැලැස්මක් සඳහා අනුමැතිය ඉල්ලමින් ප්‍රාදේශීය සභාවට අයදුම් කළේය. ඒ අනුව සැලැස්ම අනුමත විය. බිම් මහලේ කටයුතු නිම වූ පසු X ඉගැන්වීමේ කටයුතු ආරම්භ කළේය. වසර කිහිපයකට පසු, පළමු මහලේ ඉදිකිරීම් ආරම්භ කළ නමුත් ප්‍රදේශවාසීන්ගේ සහ ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේලාගේ විරෝධය හේතුවෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු විසින් යොමු කරන ලද ලිපියක් මත ප්‍රාදේශීය සභාව විසින් මෙම ඉදිකිරීම් අත්හිටුවන ලෙස ඉල්ලා සිටින ලදී. MBRA/2-SAD/10/Cont.Geno/2013 චක්‍රලේඛය අනුව ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලබාගත් අනුමැතිය ඉදිරිපත් කරන මෙන් ද X ගෙන් ඉල්ලා සිටින ලදී.


**සිද්ධි අධ්‍යයනය - අ හැසිරවීම**

*පියවර 1: උල්ලංඝනය තීරණය කිරීම*

මෙම නිදර්ශනයේදී, *එම්.ජේ.එම් ෆරිල් හා තවත් අය එදිරිව බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව සහ තවත් අය*[21] නඩුවේ සඳහන් කර ඇති කරුණුවලට සමානව අදාළ ආගමික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා නීත්‍යානුකූලව බලපත්‍රය ලබා ගන්නා ලදී. උල්ලංඝනයක් නිර්ණය කිරීමේ වගන්තියට අනුව, මෙම සිද්ධිය X ට සිය ආගම ප්‍රකාශ කිරීමට ඇති නිදහස සම්බන්ධ වූ අතර, ඔවුන්ගේ ආගමික අනන්‍යතාවය හේතුවෙන් ඉදිකිරීම් අත්හිටුවන මෙන් ලිපියක් ලැබීම මගින් නීතිය ක්‍රියාත්මක කිරීමේදී X ව වෙනස් කොට සැලකීමකට භාජනය විය. ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු හරහා ලිපිය භාරදීම තර්ජනයක් හෝ බිය ගැන්වීමේ උපක්‍රමයක් ලෙස නීතිඥයෙකුට ද සැලකිය හැකිය. පහත දැක්වෙන රූප සටහන 2 මගින් මෙම සිදුවීමට අදාළ විය හැකි සියලුම උල්ලංඝනයන් තක්සේරු කර, කුමන ආයතනයෙන් සහය පැතිය යුතුද යන්න තීරණය කළ හැකි පරිදි නීතිඥයාට සහ සේවාදායකයා ඒවා පැහැදිලි කොට දැක්වේ.

[21] 21 SC (F.R.) No. 92/2016.

රූප සටහන 2




නීතිවේදියා විසින් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීමට හෝ ප්‍රචණ්ඩත්වයට හේතු වූ නිශ්චිත ක්‍රියාව කුමක්ද යන්න තීරණය කළ යුතුය.

*පියවර 2:අධිකරණය තෝරා ගැනීම*

| | | |
|---|---|---|
| **I. උල්ලංඝනයේ ස්වභාවය කුමක්ද?** | නීතියක්, නියාමනයක් හෝ මාර්ගෝපදේශයක් | නැත |
| | **වාචික හෝ ලිඛිත සන්නිවේදනයක්** | **ඔව්** |
| | අත්අඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම | නැත |
| | කායික ප්‍රචණ්ඩ ක්‍රියාවක් | නැත |
| | කායික නොවන ප්‍රචණ්ඩ ක්‍රියාවක් (තර්ජනය හෝ හිරිහැර කිරීම) | නැත |

| | | |
|---|---|---|
| **II. උල්ලංඝනය සඳහා වගකිව යුතු හෝ එයට සම්බන්ධ කවුද?** | **රාජ්‍ය නිලධාරීන්** | **ඔව්** |
| | රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇති රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්? | නැත |
| | ක්‍රියාකාරකම් දිරිගැන්වීම හෝ ඉවසා සිටීමේ රාජ්‍ය සහය සහිත රාජ්‍ය නොවන ක්‍රියාකාරී කණ්ඩායම් හෝ පුද්ගලයන්? | නැත |

නීතිඥවරයාට තම සේවාදායකයාගෙන් උපදෙස් ලබා ගැනීමේදී පහත විකල්ප ඉදිරිපත් කළ හැකිය:

| අංක. | උල්ලංඝනයේ වර්ගය | ක්‍රියාකරු | චෝදිත හැසිරීම | සහන | අධිකරණය |
|---|---|---|---|---|---|
| **1.** | වෙනස් කොට සැලකීම | රාජ්‍ය නිලධාරි | නීතිය අනුගමනය නොකිරීම (කණ්ඩායමක් විසින් විරෝධතා එල්ල කිරීම මත හේතු නොදක්වා ඉදිකිරීම් අත්හිටුවීමට උපදෙස් නිකුත් කිරීම) | සර්ෂියෝරාරි රිට් ආඥාව | අභියාචනාධිකරණය |

| | | | | | |
|---|---|---|---|---|---|
| **2.** | FoRB උල්ලංඝනය ; වෙනස් කොට සැලකීම | රාජ්‍ය නිලධාරි | ඔබේ සේවාදායකයාගේ ආගමික අනන්‍යතාවය හේතුවෙන් එක් පිරිසකට ඔබේ සේවාදායකයාට වඩා වෙනස් ලෙස සැලකීම | මූලික අයිතිවාසිකම් (වගන්තිය 12, 14(1)(ඉ) / මානව හිමිකම් කොමිෂන් සභා පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය / මානව හිමිකම් කොමිෂන් සභාව (මානව හිමිකම් කොමිෂන් සභාව) |

**ආගමික ආයතනයක් ඉදිකිරීම හෝ නඩත්තු කිරීම නියාමනය පිළිබඳ වැඩිදුර නිදර්ශන:**

***නිදර්ශනය 1***

B යනු කුඩා ක්‍රිස්තියානි පල්ලියක දේවගැතිවරයෙකු වන අතර වන්දනා කටයුතු සඳහා ඔවුන්ගේ පුද්ගලික නිවස භාවිතා කිරීමට ඔහු අදහස් කරයි. ඔහු නේවාසික පරිශ්‍ර සඳහා ගොඩනැගිලි සැලැස්මක් නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8J(1) වගන්තිය යටතේ අනුමත කොට ලබා ගනී. එම පරිශ්‍රයේ සිදු වන ක්‍රියාකාරකම් සහ චාරිත්‍ර චාරිත්‍ර මහජන පීඩාවකට හේතු වී ඇති බවට ප්‍රදේශවාසීන් පැමිණිලි කරනු ලදුව අනුමත බලධාරියා විසින් එම ඉදිකිරීම අත්හිටුවා ඇත. එහෙයින් B එයට නීතිමය පිළියමක් සොයයි (සිද්ධි අධ්‍යයනය C ද බලන්න).

***නිදර්ශනය 2***

සියවස් ගණනාවක සිට A නමැති කෝවිල උතුරු පළාතේ ගමක පිහිටා තිබේ. කෝවිල් භූමිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධිකාරය යටතේ පවතින පෞරාණික ස්මාරක වලින් සමන්විත වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීහු A කෝවිල පිහිටි ස්ථානයේ පුරාවිද්‍යා භූමියක් නැරඹීමට පැමිණෙති. මෙම ප්‍රදේශයේ හින්දු සහ බෞද්ධ ප්‍රජා අතර ආගමික අවකාශය සම්බන්ධයෙන් දීර්ඝ කාලීන ආරවුලක් පවතී. මෙම ස්ථානය බෞද්ධ ජනතාවට අයත් බව ද, මෙම ස්ථානයේ පැරණි බෞද්ධ සිද්ධස්ථානයක් පැවති බවද එම නිළධාරීහු පවසති. බෞද්ධ පුදබිමට එම කෝවිල ආගන්තුක බවත්, එම සිද්ධස්ථානය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා කැණීම් කටයුතු ආරම්භ කළ යුතු බවත් ඔවුහු කියා සිටිති. මෙම ව්‍යාපෘතිය සඳහා දැනට පවතින කෝවිල් ගොඩනැගිල්ලේ කොටසක් ඉවත් කිරීම අවශ්‍ය වේ. හින්දු ආගමික ප්‍රදේශවාසීන් කෝවිලේ කොටසක් ඉවත් කිරීමට විරෝධය පළ කරමින් නීතිමය පිළියමක් අපේක්ෂා කරති.

***(1) ආගමික කටයුතුවල නිරතවීමට සීමා පැනවීම***

ආගමික කටයුතුවල නිරතවීමට සීමා පැනවීම සඳහා උදාහරණ ලෙස ආගමික ඇඳුම් පැළඳුම් තහනම් කිරීම, අවමංගල්‍ය චාරිත්‍ර වැනි ආගමික වතාවත් තහනම් කිරීම, ආගමික ඉගැන්වීම් තහනම් කිරීම සහ ආගමික චාරිත්‍ර විධි, රැස්වීම් සහ උත්සව නියාමනය කිරීම ඇතුළත් වේ.

**සිද්ධි අධ්‍යයනය - ආ**


ඉස්ලාමීය සටන්කාමී කණ්ඩායමක් විසින් ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල කිරීමෙන් අනතුරුව, රජය හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කොට හදිසි රෙගුලාසි (ERs) හඳුන්වා දෙයි. එහි එක් රෙගුලාසියක් වන්නේ: 'කිසියම් පුද්ගලයෙකු තමාව හඳුනා ගැනීමට යම් බාධාවක් වන පරිදි සම්පූර්ණ මුහුණ ආවරණය කෙරෙන කිසිදු වස්ත්‍රයක්, ඇඳුමක් හෝ වෙනත් ද්‍රව්‍යයක් කිසිඳු පොදු ස්ථානයක නොඇඳිය යුතුය.' Z නම් මුස්ලිම් කාන්තාව නිකාබයක් හැඳ සිටින අතර මුරපොලකදී නතර කරනු ලැබේ. මුරපොලේදී ඇයට තර්ජනය හා හිරිහැර කෙරේ.

**සිද්ධි අධ්‍යයනය - ආ හැසිරවීම**

*පියවර 1: උල්ලංඝනය තීරණය කිරීම*

මෙම නිදර්ශනයේදී, හදිසි රෙගුලාසිවල භාවිතා වන්නේ මධ්‍යස්ථ භාෂාවකි. එහි කාන්තාවන් හෝ ඉස්ලාම් පිළිබඳ සඳහනක් නොකෙරේ. එහෙත්, හදිසි රෙගුලාසි නිකුත් කරන ලද සන්දර්භය සැලකිල්ලට ගැනීමේදී, ඉස්ලාම් දහම පිළිපදින ඇතැම් කාන්තාවන් විසින් පූර්ණ මුහුණු ආවරණ භාවිතා කරනු ලැබීම තහනම් කිරීමට එය ප්‍රායෝගිකව පනවා තිබේ. එබැවින්, හදිසි රෙගුලාසි මගින් නිශ්චිත ආගමික පිළිවෙතක් වක්‍රව ඉලක්ක කර ගැනීමේ අරමුණක් ඇති බවට තර්ක කළ හැකිය. Z තර්ජන සහ හිරිහැරවලට ලක් වූයේ ඇයගේ ආගමික අනන්‍යතාවය හේතුවෙනි. පහත දැක්වෙන රූප සටහන 3 මගින් මෙම සිදුවීමට අදාළ විය හැකි සියලුම උල්ලංඝනයන් තක්සේරු කර, කුමන ආයතනයෙන් සහය පැතිය යුතුද යන්න තීරණය කළ හැකි පරිදි නීතිඥයාට සහ සේවාදායකයාට ඒවා පැහැදිලි කොට දක්වනු ලැබේ.

**රූප සටහන 3**




නීතිඥයා විසින් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීමට (FoRB) හෝ ප්‍රචණ්ඩත්වයට හේතු වූ නිශ්චිත ක්‍රියාව කුමක්ද යන්න තීරණය කළ යුතුය.

*පියවර 2: අධිකරණය තෝරා ගැනීම*

| | | |
|---|---|---|
| **I.** **උල්ලංඝනයේ ස්වභාවය කුමක්ද?** | **නීතියක්, නියාමනයක් හෝ මාර්ගෝපදේශයක්** | **ඔව්** |
| | වාචික හෝ ලිඛිත සන්නිවේදනයක් | නැත |
| | අතඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම | නැත |
| | කායික ප්‍රචණ්ඩ ක්‍රියාවක් | නැත |
| | **කායික නොවන ප්‍රචණ්ඩ ක්‍රියාවක් (තර්ජනය හෝ හිරිහැර කිරීම)** | **ඔව්** |

| | | |
|---|---|---|
| **II.** **උල්ලංඝනය සඳහා වගකිව යුතු හෝ එයට සම්බන්ධ කවුද?** | **රාජ්‍ය නිලධාරීන්** | **ඔව්** |
| | රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇති රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්? | නැත |
| | ක්‍රියාකාරකම් දිරිගැන්වීම් හෝ ඉවසා සිටීමේ රාජ්‍ය සහය සහිත රාජ්‍ය නොවන ක්‍රියාකාරී කණ්ඩායම් හෝ පුද්ගලයන්? | නැත |

නීතිඥවරයාට තම සේවාදායකයාගෙන් උපදෙස් ලබා ගැනීමේදී පහත විකල්ප ඉදිරිපත් කළ හැකිය:

| අංක. | උල්ලංඝනයේ වර්ගය | ක්‍රියාකරු | චෝදිත හැසිරීම | සහන | අධිකරණය |
|---|---|---|---|---|---|
| **1.** | FORB උල්ලංඝනය ; වෙනස් කොට සැලකීම | රාජ්‍ය නිලධාරියෙකු | ඔබේ සේවාදායකයාගේ ආගමික අනන්‍යතාවය හේතුවෙන් ඇයව වෙනස් කොට සැලකීම | මූලික අයිතිවාසිකම් (වගන්ති12, 14(1)(ඉ)) / මානව හිමිකම් කොමිෂන් සභා පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය / මානව හිමිකම් කොමිෂන් සභාව |

**සිද්ධි අධ්‍යයනය - ඇ**

Q යනු පිටිසර ගමක දේවගැතිවරයෙකි. Q ඔහුගේ නිවසේ දෛනික දේව මෙහෙයක් පැවැත්වීම ආරම්භ කළේය. Q ගේ නිවසට විශාල පිරිසක් රැස්ව සිටි බවට ගම්වාසීහු පොලිසියට පැමිණිලි කරති. මෙම රැස්වීම් හේතුවෙන් ප්‍රදේශවාසීන්ට හිරිහැරයක් සහ පීඩාවක් සිදුවන බවට ඔවුහු චෝදනා කරති. අවස්ථා කිහිපයකදීම Q ගේ නිවසට ගල්මුල් ප්‍රහාර එල්ල කරමින් දෛනික දේව මෙහෙයට බාධා කිරීමට ප්‍රදේශවාසීන් කටයුතු කරන අයුරු දක්නට ලැබිණි. මෙම කාරණය මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ගෙන ගිය පසු මහේස්ත්‍රාත්වරයා අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 98 වැනි වගන්තිය යටතේ Q ගේ කටයුතු තාවකාලිකව අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කරයි.

**සිද්ධි අධ්‍යයනය - ඇ හැසිරවීම**

*පියවර 1: උල්ලංඝනය තීරණය කිරීම*

මෙම නිදර්ශනයේ, දේව මෙහෙය අතරතුර පැමිණිලිකරුගේ නිවස වෙත ගල්මුල ප්‍රහාර එල්ල කර ඇත. කෙසේ වෙතත්, Q ගේ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 98 වැනි වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණය විසින් අතුරු නියෝගයක් නිකුත් කර ඇත. පහත දැක්වෙන රූප සටහන 4 මගින් මෙම සිදුවීමට අදාළ විය හැකි සියලුම උල්ලංඝනයන් තක්සේරු කර, කුමන ආයතනයෙන් සහය පැතිය යුතුද යන්න තීරණය කළ හැකි පරිදි නීතිඥයාට සහ සේවාදායකයාට ඒවා පැහැදිලි කොට දක්වනු ලැබේ.

**රූප සටහන 4**




නීතිඥයා විසින් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීමට (FoRB) හෝ ප්‍රචණ්ඩත්වයට හේතු වූ නිශ්චිත ක්‍රියාව කුමක්ද යන්න තීරණය කළ යුතුය..

*පියවර 2:අධිකරණය තෝරා ගැනීම*

| | | |
|---|---|---|
| **I.**<br><br>**උල්ලංඝනයේ ස්වභාවය කුමක්ද?** | නීතියක්, නියාමනයක් හෝ මාර්ගෝපදේශයක් | නැත |
| | **වාචික හෝ ලිඛිත සන්නිවේදනයක්** | **ඔව්** |
| | අතඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම | නැත |
| | **කායික ප්‍රචණ්ඩ ක්‍රියාවක්** | **ඔව්** |
| | කායික නොවන ප්‍රචණ්ඩ ක්‍රියාවක් (තර්ජනය හෝ හිරිහැර කිරීම) | නැත |

| | | |
|---|---|---|
| **II.**<br><br>**උල්ලංඝනය සඳහා වගකිව යුතු හෝ එයට සම්බන්ධ කවුද?** | **රාජ්‍ය නිලධාරීන්** | **ඔව්** |
| | රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇති රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්? | නැත |
| | **ක්‍රියාකාරකම් දිරිගැන්වීම් හෝ ඉවසා සිටීමේ රාජ්‍ය සහය සහිත රාජ්‍ය නොවන ක්‍රියාකාරී කණ්ඩායම් හෝ පුද්ගලයන්?** | **ඔව්** |

නීතිඥවරයාට තම සේවාදායකයාගෙන් උපදෙස් ලබා ගැනීමේදී පහත විකල්ප ඉදිරිපත් කළ හැකිය:

| අංක. | උල්ලංඝනයේ වර්ගය | ක්‍රියාකරු | චෝදිත හැසිරීම | සහන | අධිකරණය |
|---|---|---|---|---|---|
| **1.** | මහේස්ත්‍රාත්වරයාගේ අතුරු නියෝගය අනුව එම නියෝගයට එරෙහිව අභියාචනා කරන ලෙස පැමිණිලිකරුට උපදෙස් දිය හැකිය. | | | සංශෝධන අයදුම්පත | මහාධිකරණය |
| **2.** | ආගමික ප්‍රචණ්ඩත්වය | ප්‍රචණ්ඩත්වය දිරිගැන්වීම හෝ ඉවසීම සහිත රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් (කණ්ඩායම් හෝ පුද්ගලයන්). | පහරදීම්, දේපළ විනාශ කිරීම, තර්ජනය කිරීම, බියවැද්දීම | දණ්ඩ නීති සංග්‍රහයේ 340-349, 408-421, 483-487 වගන්ති හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 හෝ 98 වගන්ති යටතේ ගොනු කරන ලද අපරාධ නඩුවහෝ ICCPR පනතේ 3 වන වගන්තිය | මහාධිකරණය හෝ මහේස්ත්‍රාත් අධිකරණය |
| **3.** | FORB උල්ලංඝනය ; වෙනස් කොට සැලකීම | රාජ්‍ය නිලධාරියෙක් | ඔබේ සේවාදායකයාගේ ආගමික අනන්‍යතාවය නිසා ඔහුට/ඇයට වෙනස් කොට සැලකීම | මූලික අයිතිවාසිකම් (වගන්ති12, 14(1)(e)) / මානව හිමිකම් කොමිෂන් සභා පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය / මානව හිමිකම් කොමිෂන් සභාව |

**ආගමික පිළිවෙත් සීමා කිරීම පිළිබඳ වැඩිදුර නිදර්ශනය**

***නිදර්ශනය 3***

පොලිස් ආඥාපනතේ 80 වැනි වගන්තිය යටතේ පැමිණිලිකරුවන්ට (ප්‍රදේශයේ මුස්ලිම් පල්ලියක සාමාජිකයන්ට) ශබ්ද විකාශන බලපත්‍රයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. පල්ලියේ සිට යාඥාව සඳහා කැඳවීමේදී සීමා කිරීමකින් තොරව ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා අවසරය ඉල්ලා ඇත. සීමා රහිතව ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීම නිසා වෙනත් ආගම්වලට අයත් පුද්ගලයන්ට යාඥාව බලෙන් අස්සවනු ලැබීමක් (බන්ධනස්ථ ශ්‍රාවකයින් බවට පත් වීම) සිදු වන බවත්, ශබ්ද විකාශන යන්ත්‍රවලින් නිකුත් වන අධික ශබ්දය හේතුවෙන් සෞඛ්‍යයට බලපෑම් ඇති වන බවත් පොලිස් බලධාරීහු ප්‍රකාශ කළහ.

### *නිදර්ශනය 4*

D යනු යෙහෝවාගේ සාක්ෂිකරුවන් අදහන අයෙකි. යෙහෝවාගේ සාක්ෂිකරුවන්ගේ මූලධර්මවලට අනුව ඔවුන් තම ආගමික විශ්වාසය ප්‍රචාරය කිරීමේ අරමුණින් ගෙයින් ගෙට ගොස් සංචාරය කළ යුතුය. D ඇගේ ධර්මදූත සේවයේ කොටසක් ලෙස අනුරාධපුරයේ ගමක නිවසක් තුළට ගොස් ආගමික පත්‍රිකා බෙදා හරියි. බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ තවත් ගම්වැසියන් කිහිප දෙනෙක් පසුව නිවසට ඇතුළු වී බලහත්කාරයෙන් පුද්ගලයන් ආගමට පරිවර්තනය කිරීමට උත්සාහ කළ බවට D ට චෝදනා කරති. පසුව D ප්‍රදේශයේ පොලිස් ස්ථානයට රැගෙන යන අතර එහිදී බෞද්ධ භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකු සහ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා ඇයට බැණ වැදී ඇත. සාපරාධී බිය ගැන්වීම් සහ සාපරාධී අනවසරයෙන් ඇතුළුවීම සම්බන්ධයෙන් සැකපිට D ව අත්අඩංගුවට ගෙන රැයක් පුරා අත්අඩංගුවේ තබා ගනී. විමර්ශන අවසන් වීමෙන් අනතුරුව, D ට එරෙහිව නඩු පැවරීමක් සිදු නොවේ. පසුව D නීතිමය පිළියමක් සොයයි.

### *නිදර්ශනය 5*

R නම් කිතුනු භක්තිකයා හදිසියේ ඇති වූ රෝගාබාධයක් හේතුවෙන් මිය ගිය අතර ඔහුගේ පවුලේ සාමාජිකයන් මිය ගිය අයගේ දේහය පොදු සුසාන භූමියේ මිහිදන් කිරීමට තීරණය කරති. අවමංගල්‍ය කටයුතු අතරතුර දී 100ක පමණ පිරිසක් පැමිණ එම සුසාන භූමියේ කිතුනුවන් මිහිදන් කළ නොහැකි බව පවසමින් කටයුතුවලට බාධා කරති. පසුව මැර පිරිස අවමංගල්‍ය උත්සවයට රැස්ව සිටි අයට පහර දෙති. එම ස්ථානයේ සිටි පොලිසියට තත්ත්වය පාලනය කිරීමට නොහැකි වේ. පැය කිහිපයකට පසු, ගම්වාසීන්ගේ (මැර කල්ලියට සහය දෙන) බලපෑම් හේතුවෙන් R ගේ පවුලේ අයට පොලිස් ආරක්ෂාව යටතේ කිලෝමීටර් 15 ක් දුර ස්ථානයක අවසන් කටයුතු සිදු කිරීමට සිදු වේ.

#### *(2) ආගමික අනන්‍යතාව මත පදනම්ව වෙනස් කොට සැලකීම*

ආගම පදනම් කොට ගෙන මූලික සේවාවන් සඳහා ඇති ප්‍රවේශය අවහිර කිරීම, රැකියාවේදී වෙනස් කොට සැලකීම සහ පාසල්වලට ඇතුළත් කර ගැනීමේ දී වෙනස් කොට සැලකීම ආගමික අනන්‍යතාවය මත පදනම්ව වෙනස් කොට සැලකීමේ උදාහරණ වේ.

### **සිද්ධි අධ්‍යයනය - ඇ**


පැමිණිලිකාරිය රජයේ පාසලක ගුරුවරයෙකි. ඇය පාසලට අබායාව ඇඳීම නිසා ඇයගේ රැකියාව අවසන් කරන ලදී. තමාට පාසල තුළ මධ්‍යස්ථ පරිසරයක් පවත්වා ගැනීමට අවශ්‍ය බව සේවා යෝජකයා පවසා සිටින අතර, ගුරුවරුන් අබායාව පැළඳීම මගින් සිසුන්ට බලපෑමක් එල්ල විය හැකි අතර, ඔවුන්ගේ ආගම ඇදහීමේ අයිතියට හෝ හැකියාවට බලපෑම් සිදු කළ හැකි බව පවසයි.

**සිද්ධි අධ්‍යයනය - ඇ: හැසිරවීම**

*පියවර 1: උල්ලංඝනය තීරණය කිරීම*

මෙම නිදර්ශනයේ දී, පැමිණිලිකරුගේ රැකියාව අවසන් කිරීම, ඇය රැකියාවට අබායාව පැළඳීමට තීරණය කිරීම හා ඍජුව සම්බන්ධ වේ. සිය ආගමික විශ්වාසයන් ප්‍රකාශ කරන ඇඳුමක් ඇඳීමට පැමිණිලිකාරියට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීමක් ලෙස එය සැලකිය හැකිය. ආගම විෂයක් ලෙස ඉගැන්වීම හැර රජයේ විෂයමාලාව ආගමෙන් වෙන්ව පවතී. එබැවින්, සිසුන්ට සහ ඔවුන්ගේ ආගම් ඇදහීමේ හැකියාවට සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට ගුරුවරයෙකුගේ ඇඳුම සමත් නොවන බවට නීතිඥයෙකුට තර්ක කළ හැකිය. පහත දැක්වෙන රූප සටහන 5 මගින් මෙම සිදුවීමට අදාළ විය හැකි සියලුම උල්ලංඝනයන් තක්සේරු කර, කුමන ආයතනයෙන් සහය පැතිය යුතුද යන්න තීරණය කළ හැකි පරිදි නීතිඥයාට සහ සේවාදායකයාට ඒවා පැහැදිලි කොට දක්වනු ලැබේ.

රූප සටහන **5**




නීතිඥවරයා විසින් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීමට (FoRB) හෝ ප්‍රචණ්ඩත්වයට හේතු වූ නිශ්චිත ක්‍රියාව කුමක්ද යන්න තීරණය කළ යුතුය.

*පියවර 2:අධිකරණය තෝරා ගැනීම*

| | | |
|---|---|---|
| **I.**<br><br>**උල්ලංඝනයේ ස්වභාවය කුමක්ද?** | නීතියක්, නියාමනයක් හෝ මාර්ගෝපදේශයක් | නැත |
| | **වාචික හෝ ලිඛිත සන්නිවේදනයක්** | **ඔව්** |
| | අතඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම | නැත |
| | කායික ප්‍රචණ්ඩ ක්‍රියාවක් | නැත |
| | කායික නොවන ප්‍රචණ්ඩ ක්‍රියාවක් (තර්ජනය හෝ හිරිහැර කිරීම) | නැත |

| | | |
|---|---|---|
| **II.**<br><br>**උල්ලංඝනය සඳහා වගකිව යුතු හෝ එයට සම්බන්ධ කවුද?** | **රාජ්‍ය නිලධාරීන්** | **ඔව්** |
| | රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇති රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්? | නැත |
| | ක්‍රියාකාරකම් දිරිගැන්වීම හෝ ඉවසා සිටීමේ රාජ්‍ය සහය සහිත, රාජ්‍ය නොවන ක්‍රියාකාරී කණ්ඩායම් හෝ පුද්ගලයන්? | නැත |

නීතිඥවරයාට තම සේවාදායකයාගෙන් උපදෙස් ලබා ගැනීමේදී පහත විකල්ප ඉදිරිපත් කළ හැකිය:

| අංක. | උල්ලංඝනයේ වර්ගය | ක්‍රියාකරු | චෝදිත හැසිරීම | සහන | අධිකරණය |
|---|---|---|---|---|---|
| **1.** | FORB උල්ලංඝනය ; වෙනස් කොට සැලකීම | රාජ්‍ය නිලධාරියෙකු | ඔබේ සේවාදායකයාගේ ආගමික අනන්‍යතාවය නිසා ඔහුට වෙනස් කොට සැලකීම | මූලික අයිතිවාසිකම් (වගන්ති12, 14(1)(e)) / මානව හිමිකම් කොමිෂන් සභා පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය / මානව හිමිකම් කොමිෂන් සභාව |

**ආගමික අනන්‍යතාවය නිසා වෙනස් කොට සැලකීම කිරීම පිළිබඳ වැඩිදුර නිදර්ශන**

***නිදර්ශනය 6***

පැමිණිලිකරු බෞද්ධාගමිකයෙකු වන අතර තම දරුවා නිවසට ආසන්නයේ පිහිටි ආධාර ලබන (එනම් 'අර්ධ රාජ්‍ය') කතෝලික පාසලකට ඇතුළත් කිරීමට අදහස් කරයි. බෞද්ධ සිසුන් සඳහා පාසලෙන් ලබා දෙන කෝටාව ඉක්මවා යමින් බෞද්ධ දෙමව්පියන්ගේ අයදුම්පත් ලැබීම හේතුවෙන් දරුවාට පළවන ශ්‍රේණිය සඳහා පාසලට ඇතුළත් කර ගැනීමේ අයදුම්පත ප්‍රතික්ෂේප වේ. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයේ 3.2 වගන්තිය ක්‍රියාත්මක කිරීමට පාසල අපොහොසත් වූ බව පැමිණිලිකරු කියා සිටියි. පාසල රජයට පවරා ගැනීමේදී විවිධ ආගම්වලට අයත් දරුවන්ගේ අනුපාතය පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්විය යුතු බවයි.

***(3)*** ආගමික අනන්‍යතාවයට අදාළ ප්‍රචණ්ඩත්වය

ආගමික අනන්‍යතාවයට අදාළ ප්‍රචණ්ඩත්වය යන්නට පුද්ගලයන්ට හෝ දේපළවලට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා මෙන්ම ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට රජය මැදිහත් වී ක්‍රියා නොකිරීමද ඇතුළත් වේ.

**සිද්ධි අධ්‍යයනය - ඉ**


රථවාහන අනතුරක් හේතුවෙන් මුස්ලිම් ජාතිකයින් හතර දෙනෙකුගේ පහරදීමට ලක්ව තුවාල ලබා මිය ගිය සිංහල ජාතිකයෙකුගේ මරණයට පළිගැනීමක් ලෙස X දිස්ත්‍රික්කයේ නගර කිහිපයක මුස්ලිම් ජාතිකයින්ට අයත් ව්‍යාපාරවලට සහ ආගමික ස්ථානවලට මැර පිරිසක් පහර දුන් බව වාර්තා වේ. සිංහල ජාතික පුද්ගලයාගේ මරණයට පළිගත යුතු බව පවසමින් සමාජ මාධ්‍යවල නිර්නාමික පරිශීලකයින් විසින් අදහස් පළ කිරීම හේතුවෙන් ප්‍රචණ්ඩත්වය උසිගන්වනු ලැබේ. මැර කල්ලිය මුස්ලිම් ජාතිකයන්ට අයත් ව්‍යාපාර කොල්ලකා ඒවාට ගිනි තබයි. ඇතැම් මුස්ලිම් කඩ හිමියන්ට මැර කල්ලිය විසින් පහර දෙනු ලැබේ. පොලිස් නිලධාරීන්ගේ බලා සිටියදීම ඔවුන්ගේ මැදිහත් වීමක් නොමැති වීම හේතුවෙන් ඇතැම් ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වේ.

**සිද්ධි අධ්‍යයනය - ඉ හැසිරවීම**

*පියවර 1: උල්ලංඝනය තීරණය කිරීම*

පහරදීම, ගිනි තැබීම, සොරකම් කිරීම, දේපළ විනාශ කිරීම, සාපරාධී අනවසරයෙන් ඇතුළුවීම සහ සාමය කඩ කිරීම වැනි වැරදි කිහිපයක් අපරාධකරුවන් විසින් සිදු කර ඇති බව පෙනී යයි. පහත දැක්වෙන රූප සටහන 6 මගින් මෙම සිදුවීමට අදාළ විය හැකි සියලුම උල්ලංඝනයන් තක්සේරු කර, කුමන ආයතනයෙන් සහය පැතිය යුතුද යන්න තීරණය කළ හැකි පරිදි නීතිඥයාට සහ සේවාදායකයාට ඒවා පැහැදිලි කොට දක්වනු ලැබේ.

**රූප සටහන 6**




ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීමට (FoRB) හෝ ප්‍රචණ්ඩත්වයට හේතු වූ නිශ්චිත ක්‍රියාව කුමක්ද යන්න නීතිඥවරයා විසින් තීරණය කළ යුතුය.

*පියවර 2:අධිකරණය තෝරා ගැනී*

| | | |
|---|---|---|
| **I.** **උල්ලංඝනයේ ස්වභාවය කුමක්ද?** | නීතියක්, නියාමනයක් හෝ මාර්ගෝපදේශයක් | නැත |
| | වාචික හෝ ලිඛිත සන්නිවේදනයක් | නැත |
| | අතඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම | නැත |
| | **කායික ප්‍රචණ්ඩ ක්‍රියාවක්** | **ඔව්** |
| | කායික නොවන ප්‍රචණ්ඩ ක්‍රියාවක් (තර්ජනය හෝ හිරිහැර කිරීම) | නැත |

| | | |
|---|---|---|
| **II.** **උල්ලංඝනය සඳහා වගකිව යුතු හෝ එයට සම්බන්ධ කවුද?** | **රාජ්‍ය නිලධාරීන්** | **ඔව්** |
| | රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇති රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්? | නැත |
| | ක්‍රියාකාරකම් දිරිගැන්වීම් හෝ ඉවසා සිටීමේ රාජ්‍ය සහය සහිත, රාජ්‍ය නොවන ක්‍රියාකාරී කණ්ඩායම් හෝ පුද්ගලයන්? | **ඔව්** |

නීතිඥවරයාට තම සේවාදායකයාගෙන් උපදෙස් ලබා ගැනීමේදී පහත විකල්ප ඉදිරිපත් කළ හැකිය:

| අංක. | උල්ලංඝනයේ වර්ගය | ක්‍රියාකරු | චෝදිත හැසිරීම | සහන | අධිකරණය |
|---|---|---|---|---|---|
| **1.** | ආගමික ප්‍රචණ්ඩත්වය | ප්‍රචණ්ඩත්වය දිරිගැන්වීම හෝ ඉවසීම සහිත රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් (කණ්ඩායම් හෝ පුද්ගලයන්). | පහරදීම, ගිනි තැබීම, සොරකම් කිරීම, දේපළ විනාශ කිරීම, සාපරාධී අනවසරයෙන් ඇතුළුවීම, සාමය උල්ලංඝනය සහ ප්‍රචණ්ඩත්වය උසිගැන්වීම | දණ්ඩ නීති සංග්‍රහයේ 340-349, 366-371, 408-421, 427-434, 483-487 හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 හෝ 98 වගන්ති යටතේ ගොනු කරන අපරාධ නඩුව | මහාධිකරණය හෝ මහේස්ත්‍රාත් අධිකරණය |

| | | | | හෝ ICCPR පනතේ 3 වන වගන්තිය | |
|---|---|---|---|---|---|
| **ii.** | ආගමික ප්‍රචණ්ඩත්වය | රාජ්‍ය ක්‍රියාකරුවෙකු (පොලිසිය) | පොලිසියේ අකර්මන්‍යතාව | මූලික අයිතිවාසිකම් (වගන්තිය 12) / මානව හිමිකම් කොමිෂන් සභාව පැමිණිලි | ශ්‍රේෂ්ඨාධිකරණය/ මානව හිමිකම් කොමිෂන් සභාව |

**ආගමික අනන්‍යතාවයට සම්බන්ධ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩිදුර නිදර්ශන**

***නිදර්ශනය 7***

නිවසක් තුළ සන්ධ්‍යා යාඥා මෙහෙයක යෙදී සිටියදී සිටි දේවගැතිවරියක් සහ තවත් කිහිප දෙනෙකුට මැර පිරිසක් විසින් පහර දෙනු ලැබේ. නිවසේ ගෘහභාණ්ඩ හා අභ්‍යන්තරයටද බරපතළ හානි සිදුවේ. පසුව ඔවුන් නිවසින් පිටතට ඇද ගෙන ගොස් එළිමහනේ දණගස්වනු ලැබේ. ඉන්පසුව, දේවගැතිවරිය ගණිකාවක් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමින් ඔවුන්ව පා ගමනින් පොලිසියට රැගෙන යති. මෙම ප්‍රහාරයට පෙර දේවගැතිවරියට තර්ජන එල්ල වී ඇති අතර ඒ සම්බන්ධයෙන් ප්‍රදේශයේ පොලිසියට පැමිණිලි කර ඇත.

***(4) භාෂණය සම්බන්ධ වැරදි***

විශේෂයෙන්ම, ආගමික සුළුතරයන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය උසිගැන්වීමේ අවස්ථා වලදී සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත (ICCP) ක්‍රියාත්මක කළ හැක. කෙසේ වෙතත්, ප්‍රායෝගිකව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA), ICCPR පනත, දණ්ඩ නීති සංග්‍රහය, පොලිස් ආඥාපනත සහ පරිගණක අපරාධ පනත යටතේ ආගමික සුළුතරයන් ඉලක්ක කර ගනිමින් නඩු පැවරීමේ ප්‍රවණතාවක් ශ්‍රී ලංකාවේ පෙනෙන්නට තිබේ.

***5.1** භාෂණය සම්බන්ධ වැරදි (සේවාදායකයා වගඋත්තරකරු වන විට)*

***නිදර්ශනය 8***

Q යනු කවියෙකු වන අතර ඔහු කවියක් ලියා මුහුණු පොතේ පළ කරයි. ප්‍රබන්ධගත කවිය කේන්ද්‍රගත වී ඇත්තේ බෞද්ධ පූජ්‍ය පක්ෂයක සාමාජිකයෙකුට ලිංගික අතවර කිරීමේ සිදුවීමක් මත ය. බෞද්ධ භික්ෂූන් පිරිසකගේ පැමිණිල්ලකට අනුව, ICCPR පනතේ 3 වන වගන්තිය සහ දණ්ඩ නීති සංග්‍රහයේ 291 වගන්තිය යටතේ Q අත්අඩංගුවට ගනු ලැබේ.

***නිදර්ශනය 9***

R යනු මුස්ලිම් කාන්තාවක් වන අතර, ඇය නැව් සුක්කානමක ලාංඡනය සහිත ඇඳුමකින් සැරසී සිටීම නිසා අත්අඩංගුවට ගනු ලැබේ. අත්අඩංගුවට ගත් නිලධාරියාට අනුව, එම ලාංඡනය පූජනීය බෞද්ධ සංකේතයකට (ධර්මචක්‍රය) සමාන වන අතර එය මහජන කැළඹීමට හේතු වී තිබේ.

***5.2** භාෂණය සම්බන්ධ වැරදි (සේවාදායකයා පැමිණිලිකරු වන විට)*

මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය හෝ සමාජ මාධ්‍ය හරහා යම් ප්‍රකාශනයක් හෝ තොරතුරක් ප්‍රකාශ කිරීම හෝ ප්‍රසිද්ධ රැස්වීමකදී කරන ලද කථාවක් හේතුවෙන් සේවාදායකයකු උසිගැන්වීම්වල ගොදුරක් විය හැකි අවස්ථා තිබේ.

**සිද්ධි අධ්‍යයනය - ඊ**

මුස්ලිම් වෙළඳසැල් හිමියෙකු සහ සිංහල පාරිභෝගිකයෙකු අතර ඇති වූ ආරවුලක ප්‍රතිඵලයක් ලෙස එම සිංහල පාරිභෝගිකයා මුස්ලිම් කඩ හිමියාට ප්‍රචණ්ඩ ලෙස පහර දී ඇත. එහිදී, මුස්ලිම් කඩ හිමියාට බරපතළ තුවාල සිදුකිරීම සම්බන්ධයෙන් සිංහල පාරිභෝගිකයා අත්අඩංගුවට ගන්නා ලදී. ඒ සමගම, මුස්ලිම්වරුන්ගේ වංචනික ව්‍යාපාර පිළිවෙත් ප්‍රශ්න කිරීම නිසා අහිංසක සිංහල ජාතිකයෙකු අත්අඩංගුවට ගත් බවට, සටන්කාමී වාර්ගික-ආගමික සංවිධානයක් විසින් WhatsApp දුරකථන යෙදවුම හරහා


කටකතාවක් ප්‍රචාරය කරන ලදී. පසුදා ප්‍රදේශයේ පොලිස් ස්ථානය ඉදිරිපිට විශාල පිරිසක් රැස්ව, සිංහල පාරිභෝගිකයා නිදහස් කරන ලෙස ඉල්ලා සිටියහ. ඉහත කී සටන්කාමී සංවිධානයේ නායකයා පොලිස් ස්ථානය ඉදිරිපිට දී රැස්ව සිටි පිරිස අමතමින්, "වංචනික මුස්ලිම් ව්‍යාපාර අවසන් කිරීමට පියවර ගන්නා ලෙස" සියලුම දේශප්‍රේමීන්ගෙන් ඉල්ලා සිටියේය. ටික වේලාවකට පසු, රැස්ව සිටි පිරිස නගරය පුරා ගමන් කරමින්, මුස්ලිම් යැයි හඳුනා ගත හැකි ව්‍යාපාරවලට පහර දීමට පටන් ගත්හ. මුස්ලිම් ජාතිකයින්ට අයත් ව්‍යාපාරික ස්ථාන කිහිපයකට ගිනි තබා, මුස්ලිම් පල්ලියකට හානි සිදු කළ අතර, පහරදීමෙන් සහ ගිනි තැබීමෙන් තුවාල ලැබූ මුස්ලිම් ජාතිකයන් කිහිප දෙනෙකු රෝහල් ගත කරන ලදී. පැමිණිලිකරු ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයෙක් වන අතර ඔහුට හා ඔහුගේ ව්‍යාපාරයට තුවාල හා අලාභ හානි සිදුවී ඇත. ඔහු විශේෂයෙන්ම, ප්‍රචණ්ඩත්වය උසිගැන්වීමේ වරදට එරෙහිව සහන පතයි.

**සිද්ධි අධ්‍යයනය - ඊ හැසිරවීම**

*පියවර 1: උල්ලංඝනය තීරණය කිරීම*

මෙම නිදර්ශනය අනුව, ප්‍රේරක සිදුවීමක් (මුස්ලිම් කඩහිමියා සහ සිංහල පාරිභෝගිකයා අතර ඇති වූ ගැටුමක්) අවස්ථාවක් කර කර ගනිමින් අපරාධකරුවන් ප්‍රදේශයේ මුස්ලිම් ව්‍යාපාරවලට එරෙහිව ප්‍රචණ්ඩ ව්‍යාපාරයක් දියත් කළ බව පෙනී ගියේය. ඔවුන් දේපළ විනාශ කිරීම හා පහර දීම් සිදු කර ඇති බව පෙනේ. පහත දැක්වෙන රූප සටහන 7 මගින් මෙම සිදුවීමට අදාළ විය හැකි සියලුම උල්ලංඝනයන් තක්සේරු කර, කුමන ආයතනයෙන් සහය පැතිය යුතුද යන්න තීරණය කළ හැකි පරිදි නීතිඥයාට සහ සේවාදායකයාට ඒවා පැහැදිලි කොට දක්වනු ලැබේ.

**රූප සටහන 7**




ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීමට (FoRB) හෝ ප්‍රචණ්ඩත්වයට හේතු වූ නිශ්චිත ක්‍රියාව කුමක්ද යන්න නීතිඥවරයා විසින් තීරණය කළ යුතුය.

*පියවර 2:අධිකරණය තෝරා ගැනීම*

| | | |
|---|---|---|
| **I.** උල්ලංඝනයේ ස්වභාවය කුමක්ද? | නීතියක්, නියාමනයක් හෝ මාර්ගෝපදේශයක් | නැත |
| | **වාචික හෝ ලිඛිත සන්නිවේදනයක්** | **ඔව්** |
| | අතඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම | නැත |
| | **කායික ප්‍රචණ්ඩ ක්‍රියාවක්** | **ඔව්** |
| | **කායික නොවන ප්‍රචණ්ඩ ක්‍රියාවක් (තර්ජනය හෝ හිරිහැර කිරීම)** | **ඔව්** |

| | | |
|---|---|---|
| **II.** | රාජ්‍ය නිලධාරීන් | නැත |
| | රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇති රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්? | නැත |

| උල්ලංඝනය සඳහා වගකිව යුතු හෝ එයට සම්බන්ධ කවුද? | ක්‍රියාකාරකම් දිරිගැන්වීම් හෝ ඉවසා සිටීමේ රාජ්‍ය සහය සහිත, රාජ්‍ය නොවන ක්‍රියාකාරී කණ්ඩායම් හෝ පුද්ගලයන්? | ඔව් |
|---|---|---|

නීතිඥවරයාට තම සේවාදායකයාගෙන් උපදෙස් ලබා ගැනීමේදී පහත විකල්ප ඉදිරිපත් කළ හැකිය:

| අංක. | උල්ලංඝනයේ වර්ගය | ක්‍රියාකරු | චෝදිත හැසිරීම | සහන | අධිකරණය |
|---|---|---|---|---|---|
| **1.** | ආගමික ප්‍රචණ්ඩත්වය | ප්‍රචණ්ඩත්වය දිරිගැන්වීම හෝ ඉවසීම සහිත රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් (කණ්ඩායම් හෝ පුද්ගලයන්). | පහරදීම්, ගිනි තැබීම්, සොරකම් කිරීම, දේපළ විනාශ කිරීම, සාපරාධී අනවසරයෙන් ඇතුළුවීම සහ සාමය කඩ කිරීම වැනි ප්‍රචණ්ඩත්වයන්ට පෙළඹවීම | ICCPR පනතේ 3 වන වගන්තිය | මහාධිකරණය |

**ඇ. චූදිතයා හෝ වග උත්තරකරු වෙනුවෙන් පෙනී සිටීම**

විත්තිකාර හෝ වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥවරයකු පෙනී සිටින්නේ නම්, අනෙක් පාර්ශවය විසින් විනිශ්වයාධිකරණය කල් තබා තීරණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, පැමිණිල්ලේ ස්වභාවය මත පදනම් ව, නීතිඥයෙකුට ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය උල්ලංඝනය කිරීමක් (ඉහත සාකච්ඡා කර ඇති පරිදි) හෝ ආගම මත පදනම්ව වෙනස්කම් කිරීමේ ක්‍රියාවක් තිබේ ද යන්න තීරණය කිරීම සඳහා තක්සේරුවක් පවත්වා ඒ අනුව ප්‍රති හිමිකම් (counter claims) ගොනු කළ හැක.

ගොනු කරන ලද නඩුව සම්බන්ධව නීතිමය පදනමක් නොමැති නම් සහ ඔබේ සේවාදායකයා නිදොස් කොට නිදහස් කර ඇත්නම්, ද්වේෂ සහගත නඩු පැවරීම සම්බන්ධයෙන් සිවිල් නඩුවක් ගොනු කිරීම පිළිබඳ ව සලකා බලා මේ සම්බන්ධයෙන් එන්තරවාසියක් නිකුත් කිරීමට නීතිඥවරයෙකුට හැකි ය.

ශ්‍රී ලංකාවේ ද්වේශ සහගත නඩු පැවරීම රෝම ලන්දේසි නීතිය යටතේ හිංසන නඩුකර (***actio injuriarum)*** මූලධර්ම මගින් පාලනය වේ. සිල්වා එදිරිව සිල්වා නඩුවේදී (***Silva v Silva***)[22] ඔප්පු කිරීමේ වගකීම පැමිණිලිකරුට (එනම් හිටපු විත්තිකරුට) පැවරී ඇති අතර, පැමිණිලිකරු විසින් පහත සඳහන් අවශ්‍යතා, සාක්ෂි වැඩි බර (preponderance of evidence) මත හෝ ශක්‍යතා වැඩි බර වැඩි බර (balance of probabilities) හෝ හිංසන චේතනාවකින් (***animo injuriandi*** මත හෝ ඔප්පු කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දක්වා ඇත. (සටහන : වලංගු හිමිකම් පෑමක් කළ හැකි ද යන්න තක්සේරු කිරීම සඳහා පහත අවශ්‍යතා සපුරාලන්නේ දැයි නීතිඥවරයා විසින් සලකා බැලිය යුතු ය):

i. ඔබේ සේවාදායකයා නඩුවෙන් නිදොස් කොට නිදහස් කර තිබුණි ද?
ii. සාවද්‍ය චෝදනාවකට නඩු පැවරීමක් කර තිබුණි ද?
iii. නඩු පවරන ලද්දේ ද්වේශ සහගතව හෝ හිංසන චේතනාවකින් (***animo injuriandi)*** මිස මහජන යුක්තිය තහවුරු කිරීමේ අරමුණින් නොවේ ද?
iv. එවැනි ක්‍රියාවක් සඳහා සාධාරණ හෝ සම්භාව්‍ය හේතුවක් තිබුණි ද?

ද්වේෂ සහගත නඩු පැවරීමේ හිමිකම් පෑමක් සාර්ථක කර ගැනීම සඳහා, තමාට ඇත්ත වශයෙන් ම සහ නීතියෙන් හිමිකම් පෑම සඳහා හිමිකම් ඇති බව පැමිණිලිකරු විසින් ඔප්පු කළ යුතු ය.[23]

22. [2002] 2 SLR 29.

23. See *Karunaratne v Karunaratne* 63 NLR 365; *Kalu Banda v Rajakaruna* [2002] 3 SLR 44; *Saravanamuttu Vs Kanagasabai* 43 NLR 357; *Hendrick Appuhamy Vs Matto Singho* 44 NLR 459; *Pathirage Don Abeyratne v Gamage Don Chandradasa, C.A. No. 818/97 (F) decided on 23 June 2011; Tewari Vs Bhagat Singh* 24 TLR 884. For further reference see 'Text of The Law of Delict' by R.G. McKerron at p.246.

# මාධ්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීම

## 5. මාධ්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීම

විශේෂිත වූ ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය පිළිබඳ නඩුවක් සම්බන්ධයෙන් මාධ්‍ය සමඟ සන්නිවේදනය කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව මෙම කොටස මඟින් මාර්ගෝපදේශ සපයයි.[24] මාධ්‍ය සමඟ ගනුදෙනු කිරීමේ දී සාමාන්‍යයෙන් කළ යුතු සහ නොකළ යුතු දේවල් කිහිපයක් පහත ලැයිස්තුවෙන් පෙන්වා දේ.

**කළ යුතු දෑ**

- මාධ්‍යවේදීන් සමඟ සම්බන්ධ වන්න: උසාවි වාර්තාකරු ඔබේ ආදානයකින් (input) තොරව නඩුව ගැන ලිවීමේ සම්භාවිතාව ඉහළ ය.
- උසාවි දිනට පෙර සූදානම් වන්න, සහ මාධ්‍ය හා සම්බන්ධ වීමට පෙර ඔබේ මාධ්‍ය උපුටනය (media quote) සකස් කර ගන්න (සාමාන්‍යයෙන් මාධ්‍ය ප්‍රකාශ අධිකරණ ක්‍රියාවලියෙන් පසු ක්ෂණිකව ලබා දෙනු ලැබේ)
- හැකියාවක් පවතී නම් ලිඛිත උපුටා දැක්වීම් (written quotes) ලබා දීම තෝරා ගන්න. මෙම විකල්පය මඟින් ඔබට හෝ ඔබේ කණ්ඩායමට ඔබේ ප්‍රතිචාර සිතා බලා ඉදිරිපත් කිරීමට සහ මාධ්‍ය තුළ සිද්ධිය වාර්තා වන ආකාරය පාලනය කිරීමට ඉඩ සලසයි. ලිඛිත උපුටන මඟින් ප්‍රතිචාර දැක්වීමෙන් ඔබට අවශ්‍ය සියලු ම තොරතුරු ඇතුළත් කිරීමට ඔබට කාලය ලබා දෙන අතර ම මාධ්‍යවේදියාගේ පැත්තෙන් සිදු විය හැකි වැරදි වළක්වා ගැනීමටත් ඔබට අවස්ථාව සැලසෙනු ඇත.
- ඕනෑම මාධ්‍ය නියැලීමක් හෝ එවැනි උනන්දුවක් ගැන ඔබේ සේවාදායකයා දැනුවත්ව සිටින බව සහතික කිරීම සඳහාත් එවැනි නියැලීමක් ඔබේ සේවාදායකයාගේ අවශ්‍යතා ඉදිරියට ගෙන යන බව සහතික කිරීමත් උදෙසා මාධ්‍ය හා සම්බන්ධ වීමට පෙර මාධ්‍ය සමග ගණුදෙනු කිරීම පිළිබඳ ව ඔබේ සේවාදායකයා සමඟ සාකච්ඡා කරන්න.

**නො කළ යුතු දෑ**

- සදාචාරාත්මක සම්මතයන් උල්ලංඝනය නොකරන්න. නිදසුනක් වශයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති 1988 හි (නීතිඥවරයාගේ හැසිරීම සහ ආචාර විධි) දක්වා ඇති රීති අනුව,
    - නීතිඥයෙකු 'තම සේවාදායකයන්ට උපදෙස් දීමේ දී සහ ඔවුන් සමඟ කරන සියලු ගනුදෙනුවලදී සම්පූර්ණ අවංකභාවයෙන් හා විවෘතභාවයෙන් යුතුව කටයුතු කළ යුතු ය'.[25]
    - නීතිඥයෙකු 'තම සේවාදායකයාට අනර්ථකාරී සහ/හෝ අගතියක් වන අයුරින් කිසි විටෙකත් ක්‍රියා නො කළ යුතු ය'.[26]
    - නීතිඥයෙකු 'තම සේවාදායකයාගේ ව්‍යාපාර සහ කටයුතු සම්බන්ධයෙන් සහ අදාළ ව ඕනෑම කරුණක් සම්බන්ධයෙන් තම සේවාදායකයාගෙන් හෝ ඔහු වෙනුවෙන් වාචික හෝ වාර්තාමය හෝ ලබා ගත් සියලු ම තොරතුරු දැඩි විශ්වාසයකින් තබා ගත යුතු ය'.[27]

---

[24]. මේ මාර්ගෝපදේශ කරුණු උපුටාගෙන ඇත්තේ පහත දැක්වෙන මූලාශ්‍ර වලිනි: Willian Vogeler, 'Lawyer Tips: Do's and Don'ts of Speaking to Reporters', 30 May 2017, https://www.findlaw.com/legalblogs/strategist/lawyer-tips-dos-and-donts-of-speaking-to-reporters/; Nicola Kenyon, 'Dealing with the Press: What Lawyers Need to Know', 29 April 2020, https://www.lawyer-monthly.com/2020/04/dealing-with-the-press-what-lawyers-need-to-know/.

[25] 18 රීතිය, ශ්‍රේෂ්ඨාධිකරණය (නීතිඥවරයාගේ හැසිරීම සහ ආචාර විධි) රීති 1988, http://www.supremecourt.lk/images/scrules.pdf.

[26] එම., Rule 18 (a).

[27] එම., Rule 31.

- නීතිඥවරයෙකුගේ රාජකාරිය විය යුත්තේ 'සේවාදායකයා සමඟ ඔහුගේ වෘත්තීය සබඳතාව පවතින කාලය තුළ පමණක් නොව, එම නීතිඥවරයා විසින් ඉහත කී අය වෙනුවෙන් ක්‍රියා කිරීම නැවැත්වීමෙන් පසුව පවා දින නියමයක් නොමැතිව සේවාදායකයින්ගේ අභාවයෙන් පසුව ද එවැනි රහසිගත තොරතුරු හෙළිදරව් කිරීමෙන් වැළකී සිටීම ය'.[28]
- නීතිඥයෙකු 'විනිසුරු මඬුල්ලේ ස්වාධීනත්වයට බාධා නොවන පරිදි යුක්තිය නිසි ලෙස පරිපාලනය කිරීමේදී එයට සහාය වීම පිණිස උසාවියට, විනිශ්චය සභාවට සහ යුක්තිය පසිඳලීම සඳහා නිර්මාණය කරන ලද වෙනත් ආයතනයක රාජකාරියට බැඳී සිටියි'.[29]
- විරුද්ධ පාර්ශ්වයට හෝ එහි සාක්ෂිකරුවෙකු හෝ වෙනත් පුද්ගලයෙකුට අපහාස කිරීමට හෝ පහත් කොට සැලකීමේ අරමුණින් ප්‍රශ්න ඇසීම හෝ ප්‍රකාශ සිදු කිරීම නීතිඥයෙකු විසින් නො කළ යුතු ය.[30]

- අධිකරණ ක්‍රියාවලියකට අගතියක් වන ආකාරයේ ප්‍රකාශ මාධ්‍ය වෙත ලබා නොදෙන්න.[31]

[28] එම., Rule 33.
[29] එම., Rule 50.
[30] එම., Rule 53 (i).
[31] American Bar Association, Rule 3.6: Trial Publicity, at https://www.americanbar.org/groups/professional_responsibility/publications/model_rules_of_professional_conduct/rule_3_6_trial_publicity/.

## 6. ඇමුණුම 1

<u>තොරතුරු ලබා ගැනීම සඳහා අයදුම්පත</u>

තොරතුරු නිලධාරියා,

01. ඉල්ලුම්කරුගේ නම - ........................................................
02. ලිපිනය – ..................................
03. දුරකථන අංකය (ඇත්නම්) -...............................
04. විද්‍යුත් තැපැල් ලිපිනය (ඇත්නම්) - ....................
05. ඉල්ලා ඇති තොරතුරු පිළිබඳ විස්තර
    I. අදාළ මහජන අධිකාරිය
    II. ඉල්ලා ඇති තොරතුරු

    ..........................................................................................................................................................................................................................................................

    ............

    III. තොරතුරු ඉල්ලා ඇති නිශ්චිත කාලපරිච්ඡේදය (අදාළ වන්නේ නම්) ........................
06. තොරතුරු ඉල්ලා සිටින ආකාරය -
    i. අදාළ වැඩ, ලේඛන, වාර්තා පරීක්ෂා කිරීම
    ii. ලේඛනවල හෝ වාර්තාවල සටහන්, උපුටා ගැනීම් හෝ සහතික කළ පිටපත් ලබා ගැනීම
    iii. ද්‍රව්‍යවල සහතික කළ සාම්පල ගැනීම
    iv. පරිගණකයක හෝ වෙනත් උපකරණයක තොරතුරු ගබඩා කර ඇති නම් CD/DVD/ගබඩා මාධ්‍ය/තැටි(tape)/වීඩියෝ කැසට්/වෙනත් ඉලෙක්ට්‍රොනික මාදිලියක/මුද්‍රණයක ආකාරයෙන් තොරතුරු ලබා ගැනීම.
07. ඉල්ලුම්කරු වෙත ප්‍රවේශ වීමට කැමති භාෂාව: ............................
08. තොරතුරු ඉල්ලීම මගින් පුරවැසියෙකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහසට බලපෑමක් ඇති කෙරේද? (ඔව්/ නැත)

    පිළිතුර ඔව් නම්, හේතුව දක්වන්න –

    ............................................................................................................................

    ............................................................................................................................
09. වෙනත් විස්තර - ..........................................................
10. අමුණා ඇති අදාළ ලේඛන (ඇත්නම්)................................
    I. ..................................
    II. ..................................
    III.
11. ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද? (ඔව්/ නැත)

දිනය: -

අත්සන:-